# වාර්ෂික වාර්තාව 2011



Refreshingly srilanka WONDER OF ASIA

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

Refreshingly

sri lanka

WONDER OF ASIA

1. **හැඳින්වීම**
2. **සාමාන්‍ය ක්‍රියාකාරකම්**
3. **නිෂ්පාදිත සංවර්ධනය**
4. **පර්යේෂණ**
5. **පුහුණුව**
6. **ප්‍රවර්ධනයන්**
7. **වෙනත් ක්‍රියාකාරකම්**
8. **මූල්‍ය සහ පරිපාලනය**

# 1. හැඳින්වීම

පසුගිය වසරේ කාල වකවානුව තුල ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය තම කාර්යභාරයන්හි ප්‍රමුඛතාවය ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කල ශ්‍රී ලංකා සංචරණයේ උපාංගික මාර්ග සැලැස්ම මත ප්‍රතිව්‍යුහගත විය.

ශ්‍රී ලංකා සංචරණයේ සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා සංචරණයේ උපාය මාර්ගික කළමනාකරණය තුලින් MICE (රැස්වීම්, දිරිගැන්වීම්, චාරිකා, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන) සංචරනයේ විෂය පථයෙහි පුළුල්භාවය විස්තර කර ඇත. ඒ අනුව 2011-2013 වසර කාල පරිච්ඡේදයන්හි ශ්‍රී ලංකා සම්මති කාර්යංශයේ ප්‍රධාන සැලැස්ම තුල MICE සංචරනයේ වෙළඳ පල කොටස සහ ඒ තුලින් අධික වියදම් සිදු කරන සංචාරකයින් මෙරටට ගෙන්වීමේ වැඩ පිලිවෙලත් අනතර් ගත කර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයා ඉතා මහත් වු ප්‍රීතියෙන් යලි රටෙන් පිටත් වන සංචාරකයින් ලෙස සියළු සංනිවේදනයන් සහ සංචාරක සම්පත් යොදා ගැනීමට මෙම වසරේ ප්‍රධාන කාර්යය භාරයක් ලෙස ගැනුනි. එයට ප්‍රධාන සාධකය නම් පර්යේෂණයන් අනුව හෙලි වි ඇත්තේ බොහෝ සංචාරකයින් මෙරටට පැමිණ ඇත්තේ තම යහළු මිත්‍රයන්, නෑදෑයින් මෙරටට පැමිණුනු සංචාරකයින් ගෙන් ලත් තොරතුරු මත වීම නිසාවෙනි.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය තම ප්‍රාථමික වු කාර්යයන්ට අමතරව ශ්‍රී ලංකා සංචරණයේ විවිධ වු ව්‍යාපෘතීන් සඳහා දායක වී ඇත. එනම් සංස්කෘතික වැඩසටහන්, ලෝක බැංකු ව්‍යාපෘති, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධාන වැඩ සටහන් රාශියකට සම්බන්ධ වි ඇත.

**2011 MICE සංචරණයෙන් මෙරටට පැමිනි සංචාරකයින් ලෙස පහත පරිදි වාර්තා වි ඇත.**

| | |
|---|---|
| **පුරෝකථනය 2011** | **95,000** |
| **සත්‍ය 2011** | **101,947** |

| | |
|---|---|
| ජනවාරි | 8,161 |
| පෙබවරවාරි | 7,731 |
| මාර්තු | 8,264. |
| අප්‍රේල් | 6,383 |
| මැයි | 5,873 |
| ජුනි | 7,283 |
| ජුලි | 9,982 |
| අගෝස්තු | 8,696 |
| සැප්තැම්බර් | 7,226 |
| ඔක්තෝබර් | 9,739 |
| නොවැම්බර් | 10,907 |
| දෙසැම්බර් | 11,702 |

දත්ත ලබා ගැනීම / ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ පර්යේෂණ අයුර්නි 2011.

## ගරු ඇමතිතුමාගේ පණිවුඩය



*ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, ආර්ථික සංවර්ධන අමාත්‍ය*

2009 මැයි 19 දින මෙරටෙහි ඓතිහාසක දිනයක් සමරන ලදී. එනම් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අප රටේ ත්‍රස්තවාදය නැතිකොට සාමය ඇති කිරීමයි. මෙය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙන ඒමට මහත් රුකුලක් වුනි.

සංචාරක පැමිණීම් සම්බන්ධව සලකා බලන විට 2009 වසරේදී 447,890 ක් වු අතර 2010 වසරේදී 654,476 ක් විය. 2011 වසරේදී සමස්ථ සංචාරක පැමිණීම් ප්‍රමාණය 855,975 ක් විය. එ අනුව 2012 වසරේදී සමස්ථ සංචාරක ප්‍රමාණය මිලියනය ඉක්මවා 2016 වසරේදී මිලියන 2.5 ක් දක්වා ලගාවනු ඇත.

ස්ථිරසාර සංචාරක කර්මාන්තයක දියුණුව ඇති වන්නේ ආර්ථිකයේ අනෙකුත් අංශයන්ගෙන පවතින දිගුකාලීන දියුණුවත් සමගය. ශ්‍රී ලංකා රජය විසින් සංචාරක කර්මාන්තයේ ඍජු සහ චක්‍ර ප්‍රතිලාභයන් සඳහා දිගුකාලීන ආයෝජන ව්‍යාපෘතීන් දැනටමත් ක්‍රියාත්මකව ඇත. උදාහරණ වශයෙන් දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල මත්තල හම්බන්තොට දී තව නොබෝ දිනකින් වැඩ අවසන් කර 2013 වසරේදී විවෘත කිරීමට බලාපොරොත්තු වේ. එසේම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ප්‍රතිසංස්කරණය කර නවීකරණය කර ඇත. තවද අපගේ රජය රටතුල සමස්ථ මහාමාර්ග පද්ධතිය, දුම්රිය මාර්ග පද්ධතිය වැඩි දියුණු කර ඇත.

ශ්‍රී ලංකාවේ පලමු අධිවේගී මාර්ගය වන කොළඹ සහ ගාල්ල අතර මාර්ගය 2011 නොවැම්බර් මස 27 දින නිල වශයෙන් විවෘත කරන ලදි. 2011 ඔක්තෝබර් 07 දින සිට විශේෂ සුඛෝපභෝගී බස් සේවයක් කොළඹ සහ මහනුවර අතර විවෘත කරන ලදී. කොළඹ පිහිටි පැරණි ලන්දේසි ගොඩනැගිල්ල සංචාරක සාප්පු සංකීර්ණයක් සහ විවේක මධ්‍යස්ථානයක් බවට පත්කර ඇත. නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල 2011 දෙසැම්බර් 15 දින විවෘත කරන ලද අතර, මෙහි ඉතා නවීන අංගෝපාංග උපකරණ නව තාක්ෂණය උපයෝගී කරගෙන ඇති අතර සමස්ථ ආසන සංඛ්‍යාව 1,288 කි. සංචාරක කර්මාන්තය 2012 වසරේදී විදේශ විනිමය ඉපැයීම අතින් රුපියල් බිලියනය ඉක්ම වීමට බලාපොරොත්තු විය හැකිය.

සංචාරක කර්මාන්තය තුලින් ශ්‍රී ලංකාව තුල විවිධ රැකියා අවස්ථාවන් බිහි වි ඇත. ඒ අනුව අප සමස්ථ ශ්‍රී ලංකාවටම වර්තමානයේ දී සංචාරක ක්ෂෙත්‍රය විවෘත වී ඇති අතර සංචාරකයින්ට උතුරු නැගෙනහිර ඇතුළු ඕනෑම ප්‍රදේශයකට යාමට ඒමට හැකියාවක් ඇත.

අපගේ අවසන් ඉලක්කය නම්, සංචාරක ක්ෂෙත්‍රයේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාවේ සියළු ජන කොටසු වලට ගලායාමත්, බෙදී යාමත් වේ.

## සභාපතිතුමාගේ පණිවුඩය



*ආචාර්ය නාලක ගොඩහේවා මහතා, සභාපති, ශ්‍රී ලංකා සංචරණය*

2011 වසරේ සංචාරක පැමිණීම් 30.8% කින් වැඩි වී ඇත. පැමිණීමේ නියමයන්ට අනුව මූලික සංචාරක ජනනය කිරීමේ රට ඉන්දියාව වන අතර මහා බ්‍රිතාන්‍ය සහ ජර්මනිය දෙවන හා තෙවන ස්ථානයන්හි පවතී.

සංචාරක කර්මාන්තය ඉදිරියට ගෙන යාමට උපකාර වන වාතාවරණයක් රටතුල පවතී. රටේ ආර්ථිකය ගොඩ නැංවීම උදෙසා සංචාරක ව්‍යාපාරය ප්‍රධාන ක්ෂේත්‍රය ලෙස රජය විසින් යෝජනා කර ඇත.

2005 සංචාරක පනතේ 6 (2) වගන්තියට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2011- 2016 සඳහා සංචාරක සංවර්ධන උපාය මාර්ගය සකස් කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා ගන්නා ලදී.

ප්‍රධාන අරමුණු

- සංචාරක පැමිණීම් 2010 වසරේ 654,476 සිට 2016 දී මිලියන 2.5 දක්වා වැඩි කර ගැනීම.
- වසර 5 ක් අතුලතදී විදේශ ඍජු ආයෝජන ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 3,000 මෙරටට අද්දවා ගැනීම.
- සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියා 2010 වසරේ 125,000 සිට 2016 දී 500,000 දක්වා වැඩි කර ගැනීම සහ දිවයින පුරා සංචරණය මූලික කර්මාන්ත සහ සේවා වැඩි කර ගැනීම.
- සංචරණයේ ආර්ථික ප්‍රතිලාභ සමාජයට බෙදා දීම සහ සංචාරක ව්‍යාපාරය රටේ ප්‍රධාන ආර්ථිකය හා එකතු කිරීම.
- විදේශ විනිමය ආදායම 2010 දී ඇමරිකානු ඩොලර් මිලියන 500 සිට 2016 දී ඇමරිකානු ඩොලර් බිලියන 2.75 දක්වා වැඩ කර ගැනීම
- ශ්‍රී ලංකාව වෙනවෙන් ලෝක ව්‍යාප්ත ආර්ථික හා වෙළඳ සම්බන්ධතා වැඩි දියුණු කිරීම උදෙසා දායකවීම.
- සංචරණය සඳහා ලෝකයේ හොඳම දූපත ලෙස ශ්‍රී ලංකාව පත් කිරීම

සංචාරක කර්මාන්තය නොනැසී ඉදිරියටත් වර්ධනය වන බව අප විශ්වාස කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස රටේ ජනතාවගේ ආර්ථික මට්ටම වැඩ දියුණු කිරීමටත් ජීවන මට්ටම ප්‍රමිතිය උදෙසාත් යහපත සලසනු ඇත.

# 2. සාමාන්‍ය ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් පසුගිය වසර තුළද ආයතනික ක්‍රියාකාරකම් වූ පර්යේෂණ, පුහුණු සහ ප්‍රවර්ධන, විශේෂයෙන්ම MICE සංචරණයේ මිල විමසුම්, සැලසුම් සංවිධානමය කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්මන්ත්‍රණ ප්‍රදර්ශන සංවිධානය කිරීම සිදු කරන ලදි. තවද කාර්යංශය ප්‍රධාන වශයෙන්ම MICE සංචරනයේ කාර්යයන් සුපරීක්ෂණය, ආරක්ෂාව, අරමුදල් රට තුලට ගෙන ඒමට විශේෂ උත්සාහයක් ගන්නා ලදි. මෙම කාර්යයන් ශ්‍රී ලංකා සංචරනය තුලින් ආර්ථිකයේ වැදගත් කාර්යය භාරයන් ඉටු කර ලීමට මග පාදන ලදී.

2.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් 2010/2011 වසර වල MICE සංචරන කාර්යයන්ට උපදෙස් දීම සංවිධානය කිරීම, උපකාර කිරීම තුලින් විශේෂ කාර්යභාර්යක් ඉටු කරන ලදී.

- *යාපනය ජාත්‍යන්තර වෙළඳ සල්පිල 2011 ජනවාරි*





*සල්පිලේ ක්‍රියාකාරකම්*

- *කැළණි පූජාබිම සංචාරකයින් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ නාගරික හෝටල් සංගමය ඉදිරිපත් කල සංචාරක පත්‍රිකා ප්‍රවර්ධනය 2011 ජනවාරි*



*සංචාරක පත්‍රිකාව*

- *Viceroy Special Steam එන්ජින් මෙහෙයුම් කරුවන්ගේ 25 වැනි සංවත්සරය වෙනුවෙන් නිකුත් කල මුද්දර 05 විශේෂිත මාධ්‍ය සහයෝගිතා වැඩ මුළුව 2011 ජනවාරි*



මාධ්‍ය සමුළුව

- ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා කණ්ඩායම සිංගප්පූරුවේදී පවත්වන ලද Chingay පෙළපාළියට සහභාගී වීම. මෙය ආසියාතික මිලයන 20 ක් පමණ ජනකායක් නරඹන ලදී පෙබරවාරි 2011




ශ්‍රී ලංකා නර්තන කණ්ඩායම වීදි සංචාරයක

- GP14 ලෝක රුවල් ඔරු තරඟාවලිය පෙබරවාරි 2011




රුවල් ඔරු සංදර්ශනය

- 2 වැනි Tex Tech ප්‍රදර්ශනය මාර්තු 2011




ආරම්භක සමුළුව

- *Lawasia ව්‍යාපාර නීති සමුළුව මාර්තු 2011*




ආරම්භක සමුළුව

- *SLAPCEO ක්‍රියාකාරකම් MICE සමුළුව*




*SLAPCEO වෙබ් අඩවිය විවෘත කිරීම*

- *16 වැනි වාර්ෂික ඉන්දියානු සාගර Tuna කොමිසම මාර්තු 2011*






*සමුළු වාරයේ අවස්ථාවන්*

- ***එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය සංවිධාන කල 23 වැනි දකුණු ආසියාතික පැසිපික් ආසියානු කලාපීය රටවල නියෝජිත සමුළුව සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයට මාධ්‍ය දායකත්වය තේමාව කොට ගෙන කොළඹදී පවත්වන ලදී. 2011 මාර්තු 24 # 26 මෙම සමුළුව ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ දායකත්වයෙන් සාර්ථකව කොළඹදී පැවැත්වුණ.***







*ආර්ථික සමුළුව - සමුළුව ඇමතීම ආචාරිය ටැලේබ් රෆායි*

*ජාතීන් 05 ක් නියොජකය කල යාපනය සංගීත උත්සවය*



*කොළම පැවති ප්‍රසංගය*





- 8 වැනි ආසියාතික නාරි සහ ප්‍රසව විශේෂඥ වෛද්‍ය සමුළුව (SAFOG) 2011 අප්‍රේල්
- 2 වැනි ආසියාතික රථ රැලිය 2011 අප්‍රේල්
- මහේන්ද්‍ර සහ මහේන්ද්‍ර වාර්ෂික සැසිය 2011 අප්‍රේල්
- සඳකඩ පහන සංගීත ප්‍රසංගය 2011 අප්‍රේල්
- කලාපීය බලශක්ති සමුළුව 2011 අප්‍රේල්
- රොටරි ඉන්දියානු ජාත්‍යන්තර සංවිධානය පැවැත් වු සම්මන්ත්‍රණය 2011 අප්‍රේල / මැයි
- ග්‍රාමීය නිෂ්පාදන සමුළුව 2011 මැයි




ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ඉදිරිපත් කල සංස්කෘතික ප්‍රසංගය

- ඉන්දියානු අධ්‍යාපන සල්පිල
- මෝටර් රථ ප්‍රවාහන ක්ෂෙත්‍රය ඉදිරිපත් කල සම්මන්ත්‍රණය 2011 ජුනි




Inauguration

- රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථා සැපයුම්කරුවන්ගේ සමුළුව 2011, ජුනි
- 50 වැනි Afro ආසියානු නිති උපදේශක සංවිධානය (AALCO), ජුනි 2011
- ආයුර්වේද එක්ස්පෝ 2011 යෝගා භාවනානුයෝගීව ආහාර / සෞඛ්‍ය ජාත්‍යන්තර සමුළුව ජුලි 2011.



*අතිගරු ජනාධිපති තුමා සමාරම්භක උත්සවයේදී*

***ජාත්‍යන්තර මාධ්‍ය ක්‍රියාකාරකම් / ETBMICE චාරිකා, සම්මුති රැස්වීම්, සඟරා, Bedouk, Meetpie.com, ICCA වෙබ් අඩවිය මෙයට සහභාගී වන ලදී.***

- ***පැසිපික් ආසියානු කලාපීය සංඛ්‍යාන සමීක්ෂකයින්ගේ සමුළුව (PAQS) ජුලි 2011***





***සමුළුවට සහභාගී වු විදේශීය නියෝජිත මණ්ඩලයේ සාමාජිකයින් කොටසක්***




***ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා පැසිපික් ආසියානු කලාපීය සංඛ්‍යාන සමීක්ෂණ සමුළුවේ සභාපති ටියෝ වුල් සින් මහතා සමග සමුළු සමාරම්භක අවස්ථාව***




***චිත්‍රා වෙඩික්කාර මහත්මිය සංඛ්‍යාන සමීක්ෂණ ආයතනයේ සභාපතිනිය සමුළුව ඇමතු අවස්ථාව***

- *1 ව ැනි ශ්‍රී ලංකා ජාත්‍යන්තර Rhythm ලෝක නර්තන තරඟාවලිය ජුලි 2011*




ශ්‍රී ලංකා  සංචරණයේ සභාපතිතුමා ජයග්‍රාහකයින් සමග

- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ අධිවේගී මාර්ග ඉංජිනේරු ප්‍රවාහන ක්‍රියාවලිය ජූලි 2011
- ප්‍රවාහන සංනිවේදනය ප්‍රාදේශීය දකුණු ආසියානු සමුළුව ජූලි 2011




- ජාත්‍යන්තර සමුළුව Mixed Species Bird Feeding Flocks, අගෝස්තු 2011
- ලංකා අභියෝගය අගෝස්තු 2011




උත්සවයේ අවස්ථාවන් /
සංවිධායකයින් සහභාගී වූවන්

- *5 වන සාර්ක් ළමා රෝග විශේෂඥයින්ගේ සමුළුව අගෝස්තු 2011*



*ආරම්භක අවස්ථාව*

- *11 වැනි විද්‍යාත්මක ශ්‍රී ලංකා හෘද රෝග  වෛද්‍ය සංගමය 2011 අගෝස්තු*
- *10 වැනි පූර්ව ආහාර සැපයුම්, ප්‍රදර්ශනය 2011 අගෝස්තු*
- *වෙරළ ක්‍රීඩා  Negombo Sands, අගෝස්තු 2011*
- *Facet 21 ශ්‍රී  ලංකා ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ  ප්‍රදර්ශනය 2011 සැප්තැම්බර්*
- *44  වැනි වාර්ෂික කායික විශේෂඥයින්ගේ සංගමය 2011 සැප්තැම්බර්*
- *ලෝක රබර් සමුළුව 2011 සැප්තැම්බර්*
- *ආසියානු පැසිපික් සම්මන්ත්‍රණය 2011 සැප්තැම්බර් / ඔක්තෝබර්*
- 11 වැනි කොළඹ මැරතන් 2011 ඔක්තෝබර්




*මාධ්‍ය සාකච්ඡාව*

- *20 වැනි ආසියානු හෝමියෝපති වෛද්‍යවරුන්ගේ සංගමය 2011 ඔක්තෝබර්*




*සමාරම්භක අවස්ථාව*

- *10 වැනි ජාත්‍යන්තර නැගෙනහිර දකුණු ආසියාන සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 2011 ඔක්තෝබර්*



සංස්කෘතික සංදර්ශනය

- Techno ප්‍රදර්ශනය 2011 ඔක්තෝබර්
- හෝටල්, ආගන්තුක සත්කාර සහ ආහාර ශ්‍රී ල ංකා 2011 ඔක්තෝබර්




ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ පොදු බැනරය

- 4 වැනි දකුණු ආසියානු Hash සැසිය 2011 ඔක්තෝබර්
- 4 වැනි ICMIF ටකාපුල් ජාල සම්මන්ත්‍රණය 2011 නොවැම්බර්
- ජාත්‍යන්තර මානසික විද්‍යාඥයින් සහ සමාන වෘත්තිකයන්ගේ සංගමය 2011 දෙසැම්බර්
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සංගමය ශ්‍රී ලංකා තාරකා විද්‍යාඥයින්ගේ සංගමය 2011 දෙසැම්බර්
- ජාත්‍යන්තර සමුළුව ඉංජිනේරු ඉදිකිරීම් කළමනාකරණය 2011 - දෙසැම්බර් 2011
- ජාත්‍යන්තර සංඛ්‍යාලේඛණ විද්‍යාඥයින්ගේ සංගමය 2011 දෙසැම්බර්
- Kiwanis ඒෂියා පැසිපික්, 2012
- කොළඹ සංගීතමය උත්සවය 2012 අගෝස්තු
- 3 වැනි දකුණු ආසියානු මානසික විද්‍යාඥයින්ගේ සංගමය 2012 දෙසැම්බර්
- ආසියානු ළමා රෝග වැළැක්වීමේ සංගමය 2013
- නොබැඳි රටවල රාජ්‍ය නායකයින්ගේ පොදු සමුළුව 2013
- ආසියානු පැසිපික් රාජ්‍ය සෞඛ්‍ය සංගමය 2012
- 42වන SKAL ආසියානු කොන්ග්‍රසය 2013 පවත්වන ලද




මිල විමසුම් ඉදිරිපත් කිරීම ජාත්‍යන්තර SKAL කොන්ග්‍රසය

➢ *ජාත්‍යන්තර ප්‍රවාහන පහසුකම් පවත්වාගෙන යාමේ සමුළුව 2013*




*විමසුම් ග්‍රන්ථය ඉදිරිපත් කිරීම වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය*

***සාකච්ඡාවන්***

- ➢ *පෝලන්ත චාරිකා ප්‍රවාහන සංගමයේ රැස්වීම*
- ➢ *වාර්ෂික ජපන් චාරිකා ඒජන්තවරුන්ගේ සංගමය 2011 අගෝස්තු*

2.2 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය වෘත්තිමය සංවිධාන සහ සංගම් සමග ඉතා සමීපව සාකච්ඡා පවත්වාගෙන යමින් එම ආයතන වල සම්මන්ත්‍රණ සමුළු ශ්‍රී ලංකාව තුල පැවැත්වීමට වැඩ පිළිවෙලක් සිදු කරගෙන යනු ලබයි.

## 2011 වසර තුල පවත්වන ලද ක්‍රියාකාරකම් (සම්මුති, රැස්වීම් සහ දිරි ගැන්වීමේ චාරිකා හැර)

| ***ශ්‍රී ලාංකීය ආයතනය*** | ***ක්‍රියාකාරකම්*** | ***කාලය*** | ***සහභාගි වූ විදේශ නියෝජිතයන්*** |
|---|---|---|---|
| ජාත්‍යන්තර දමිළ ලේඛන සංගමය | ජාත්‍යන්තර දමිළ ලේඛන සමුළුව | 2011ජනවාරි 6-9 | 50 |
| කැළණිය රජමහා විහාරිය | වාර්ෂික උත්සවය | 2011 ජනවාරි 16-18 | 200 |
| Otis ජාත්‍යන්තර සෝපාන සංගමය | දකුණු ආසයානු ගල්ෆ කලාපීය රැස්වීම | 2011 ජනවාරි 16-20 | 25 |
| පරිසර අමාත්‍යංශය | ප්‍රාදේශිය වැඩ මුළුව කාබන් / රසායනික රහිත ආර්ථික වැඩ පිළිවෙල | 2011 ජනවාරි 19 | 65 |
| PEO/LECS | යාපනය ජාත්‍යන්තර වෙළඳ සල්පිල 2011 | 2011 ජනවාරි 21-23 1 | 175 |
| කොළඹ විශ්ව විද්‍යාලය පර්සියානු ශිෂ්‍යත්වය Elon විශ්ව විද්‍යාලය | පාරිසරික වේදීන්ගේ සංගමය | 2001 ජනවාරි 22-23 | 24 |
| අධ්‍යාපන, සංස්කෘතික එක්සත් ජනපද දෙපාර්තමේන්තුව | දකුණු සහ මධ්‍යම ආසියාතික කලාපීය සමුළුව | 2011 ජනවාරි 26-28 | 100 |

| | | | |
|---|---|---|---|
| රසායන විද්‍යා සංගමය | CHEMEX 2011 ප්‍රදර්ශනය සහ වෙළඳ සල්පිල | 2011 ජනවාරි 27-30 | 30 |
| සාර්ක් සංසකෘතික මධ්‍යස්ථානය | දකුණු ආසියාවේ ලෝක උරුමයන් සහ කලාත්මක කටයුතු කාර්යය සමුළුව | 2011 ජනවාරි 27-30 | 35 |
| Pac ඒෂියා | ලෝක අධ්‍යාපන ප්‍රදර්ශනය | 2011 ජනවාරි 28 | 55 |
| මාධ්‍ය ප්‍රදර්ශන පුද්ගලික සමුළුව | ඉන්දියානු අධ්‍යාපන ප්‍රදර්ශන සල්පිල 2011 | 2011 ජනවාරි 29-30 | 130 |
| *තාරුණ්‍යයට හෙටක්* | කාල්ටන් කලාපිය තරඟ | 2011 පෙබරවාරි 3-5 | 150 |
| ඉන්දියානු සමුද්‍ර කටයුතු සහයෝගිතා ලේකම්වරුන්ගේ සංගමය | අමාත්‍යවරුන්ගේ රැස්වීම - ඉන්දියානු ධීවර කලාපිය රැස්වීම | 2011 පෙබවාර් 7-12 | 15 |
| NCCSL | ඉන්දියානු ව්‍යාපාරික සමුළුව, ඉන්දියානු සමුළුව | 2011 පෙබරවාරි10 | 24 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය | 3 වැනි ආසියානු කලාපීය සංගමය | 2011 පෙබරවාරි 10-16 | 50 |
| එක්සත් රාජධානි අධ්‍යාපනික සමුළුව | අධ්‍යාපන එක්සත් රාජධානි ප්‍රදර්ශනය 2011 කොළඹ | 2011 පෙබරවාරි 19-20 | 80 |
| යුනෙස්කෝ සමාජ සේවා අමාත්‍යංශය | යුනෙස්කෝ සමාජ සංවර්ධන සමුළුව | 2011 පෙබරවාරි 20-22 | 20 |
| Schlumberger ඉන්දියාව | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ රැස්වීම | 2011 පෙබරවාරි 22-24 | 22 |
| යාවින් ශ්‍රී ලාංකිය සංගමය | GP 14 සමුළුව | 2011 පෙබරවාරි 21-25 | 225 |
| අධ්‍යාපනික එක්සත් රාජධානිය | එක්සත් රාජධානිය අධ්‍යාපනික ප්‍රදර්ශනය 2011 නුවර | 2011 පෙබරවාරි 22 | 14 |
| IDP අධ්‍යාපන ඕස්ට්‍රේලියාව | ඕස්ටේලියානු අධ්‍යාපනික ප්‍රදර්ශනය 2011 නුවර | 2011 පෙබරවාරි 23 | 30 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | දකුණු ආසියානු මහ බැංකුකරුවන්ගේ 46 වැනි සමුළුව | 2011 පෙබරවාරි 25-26 | 35 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 30 වැනි SEACEN මහ බැංකුකරුවන්ගේ සංගමය | 2011 පෙබරවාරි 25-26 | 30 |
| අයි. ඩී. පී. අධ්‍යාපනය / ඕසට්‍රේලියාව | ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ප්‍රදර්ශනය (කොළඹ) 2011 | 2011 පෙබරවාරි 26-27 | 12 |
| ඕස්ටේලියානු වෙළඳ කොමිසම | ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ප්‍රදර්ශනය | 2011 මාර්තු 1-2 | 35 |
| ලෙදර් නිෂ්පාදන කොමිසම ඉන්දියානු පාවහන් නිෂ්පාදන සංගමය | ගැනුම්කරුවන් / සැපයුම්කරුවන් හමුවීම | 2011 මාරතු 2-3 | 50 |

| | | | |
|---|---|---|---|
| ඒ. පී. එස්. උපදේශක සේවාව ඉන්දියාව | පලමුවැනි දකුණු ආසියා විදේශ අධ්‍යාපන උපදේශක සමුළුව | 2011 මාර්තු 2-4 | 600 |
| පී. ර. ඕ. | ටෙක්ටෙක්ස් ඉන්ටර්නැෂනල් එක්ස්පෝ 2011 | 2011 මාර්තු 3-5 | 75 |
| පී. ර. ඕ. | ඩයි චෙම් ශ්‍රී ලංකා එක්ස්පෝ 2011 | 2011 මාර්තු 3-5 | 55 |
| පී. ර. ඕ. | කොළඹ ජාත්‍යන්තර යාර්න් සහ ෆැබ්රික් ප්‍රදර්ශනය | මාර්තු 3-5 2011 | 30 |
| මහ බැංකුව ශ්‍රී ලංකාව | ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මූල්‍ය සේවා අවදානම | 2011 මාර්තු 7-11 | 25 |
| ශ්‍රී ලංකා නීතිඥ සංගමය | ව්‍යාපාරික නීති සමුළුව | 2011 මාර්තු 12-13 | 50 |
| UTO උපදේශක සමාගම | 2 වන හලාල් සමුළුව සහ ප්‍රදර්ශනය | 2011 මාර්තු 12-13 | 28 |
| ඉන්දියානු සාගර ටූනා කොමිසම | 16 වැනි වාර්ෂික සමුළුව | 2011 මාර්තු18-22 | 160 |
| සංස්කෘතික මිත්‍රත්වතා ඉන්දියානු කවුන්සිලය | ජාත්‍යන්තර බෞද්ධ සමුළුව | 2011 මාර්තු 20-21 | 30 |
| ශ්‍රී ලංකා / ඇ. එක්සත් ජනපද තානාපති කාර්යාලය | ඇ. එ. ර්. අධ්‍යාපන විශ්ව විද්‍යාල ප්‍රදර්ශනය | 2011 මාර්තු 22 | 15 |
| එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය | දකුණු සහ පැසිපක් කලාපීය ආසියාතක සමුළුව | 2011 මාර්තු 24-26 | 45 |
| දසුන මාධ්‍ය කණ්ඩායම | $*Kooriya* මත්ස්‍ය සල්පිල | 2011 මාර්තු 25-27 | 100 |
| මැලේසියානු ජාත්‍යන්තර මධ්‍යස්ථානය | මැලේසියානු අධ්‍යාපන ප්‍රදර්ශනය 2011 | 2011 මාර්තු 26-27 | 15 |
| ද ටයිම්ස් ඔෆ ඉන්ඩියා | ඉන්දියානු අධ්‍යාපනය එක්ස්පෝ 2011 | 2011 මාර්තු 29-30 | 30 |
| රසායන විද්‍යා ආයතනය | අවුරුදු අසිරිය සංහල සහ දෙමළ නව අවුරුදු සංස්කෘතික උතසවය | 2011 අප්‍රේල් 3 | 75 |
| ශ්‍රී ලංකා පොලිසිය | පොලිස් කරුණු පිළිබඳව 09 වැනි සාර්ක් කලාපීය රටවල සමුළුව **Held** | 2011 අප්‍රේල් 4-5 1 | 55 |
| ජල සැපයුම් සහ ජලාප්‍රවාහන අමාත්‍යංශය | 04 වැනි දකුණු ආසියානු සනිපාරක්ෂක සමුළුව | 2011 අප්‍රේල 4-7 | 200 |
| ලීන් කළමනාකරණ පුද්ගලික ආයතනය. | තත්ව කළමනාකරණ නඩත්තු මධ්‍යම සංගමය | 2011 අප්‍රෙල් 5 | 45 |
| ගිණුම්කරණ ප්‍රායෝගික ක්‍රම වරලත් ගණකාධිකරණ සංගමය | 25 වන ICASL ජාතික ශිෂ්‍ය සමුළුව | 2011 අප්‍රේල් 6 | 20 |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රසව සහ නාරිවේදී වෛද්‍ය සංගමය | 44 වැනි වාර්ෂික සැසිය දකුණු ආසයානු ප්‍රසව නාරිවේදී වෛද්‍ය වැඩ මුළුව | 2011 අප්‍රේල් 22-25 | 345 |
| ඉනර් වීල් දිස්ත්‍රික් 322 ශ්‍රී ලංකාව | 2 වැනි දකුණු ආසියානු රැලිය. | 2011 අප්‍රේල් 23-24 | 500 |
| රොටරි ජාත්‍යන්තර ආයතනය ඉන්දියාව | ජනාධිපති තෝරාපත් කර ගැනීමේ පුහුණු සම්මන්ත්‍රණය | 2011 අප්‍රේල් 29 මැයි 2 | 300 |
| EdCil ඉන්දියානු සමාගම | Edcil ඉන්දියානු අධ්‍යාපන ප්‍රදර්ශනය (කොළඹ) | 2011 මැයි 13-15 | 30 |
| පී. ර. ඕ. | බෘහානි එක්ස්පෝ සෙරන්ඩිබ් 2011 | 2011 මැයි 13-15 | 35 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් මණ්ඩලය | දකුණු ආසියානු විනිශ්චය කරුවන්ගේ සභාව | 2011 මැයි 13-15 | 20 |
| ශ්‍රී ලංකා චීන මාධ්‍යවේදී සංසදය | චීන අධ්‍යාපන ප්‍රදර්ශනය 2011 | 2011 මැයි 14-15 | 60 |
| EdCil ඉන්දියානු සමාගම | Edcil ඉන්දියානු අධ්‍යාපන ප්‍රදර්ශනය (යාපනය) | 2011 මැයි 17-18 | - |
| සෞඛ්‍ය අමාත්‍යංශය දකුණු ආසියානු ජාත්‍යන්තර සංගමය | ජාත්‍යන්තර සමුළුව ආහාර සුරක්ෂිතභාවය විද්‍යාත්මක නීති රීතීන් | 2011 මැයි 20-21 | 65 |
| මයික්‍රොසොෆ්ට් පුද්ගලික සමාගම | තාක්ෂණවේදී සමුළුව | 2011 මැයි 24-25 | 60 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | ත්‍රස්තවාදී පරාජය කිරීම ශ්‍රී ලාංකිය පලපුරුද්ද | 2011 මැයි 31 # ජුනි 2 | 150 |
| ව්‍යාපාති කළමනාකරණ ආයතනය | ප්‍රාදේශීය නායකත්ව සමුළුව | 2011 ජුනි 3-5 | 30 |
| තොරතුරු තාක්ෂණ ආයතනය | මාධ්‍ය වාර්ෂික රැස්වීම ආසියානු කලාපීය කර්මාන්ත කරුවන්ගේ සංවිධානය | 2011 ජුනි 6-7 | 45 |
| ශ්‍රී ලංකා ඇගයීම් සංගමටය | 3 වැනි ඇගයීම් සමුළුව | 2011 ජුනි 6-9 | 50 |
| ICTA | දකුණු ආසියාවු ජංගම සංසදය | 2011 ජුනි 7 | 45 |
| ආසියානු පදනම කොරියානු සංවර්ධන ආයතනය | සංවර්ධන කාර්යක්ෂමභාවය ආසියානු සංවර්ධන සහයෝගිතාවය | 2011 ජුනි 15-16 | 35 |
| පී. ර. ඕ. | E-Power ශ්‍රී ලංකා ප්‍රදර්ශනය | 2011 ජුනි 16-18 | 100 |
| පී.ර.ඕ. | Re-Power ශ්‍රී ලංකා ප්‍රදර්ශනය | ජුනි 16-18 2011 | 40 |
| පී.ර. ඕ. | ඔටෝමොබයිල් අමතර කොටස් ඇගලුම් කර්මාන්තය එක්ස්පෝ 2011 | 2011 ජුනි 23-25 | 75 |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව | එස්. පි. සි. සැපයුම්කරුවන්ගේ සමුළුව 2011 | 2011 ජුනි 24-26 | 100 |
| ආසියානු අප්‍රිකානු නීති සංවිධානය | 50 වැනි වාර්ෂික සැසිය | 2011 ජුනි 27 ජුලි1 | 150 |
| ශ්‍රී ලංකා රජය | කාලගුණික විපර්යාසයන් වෙනස් විම සම්බන්ධව සාර්ක් කලාපීය ජාත්‍යන්තර සමුළුව | 2011 ජුනි 29-30 | 15 |
| ලෝක නර්තන අධ්‍යනය | 1 වැනි ජාත්‍යන්තර ලෝක නර්තන තරඟාවලිය | 2011 ජුලි 3 | 60 |
| පශු සම්පත් ග්‍රාමිය සංවර්ධන අමාත්‍යංශය | ජාත්‍යන්තර පශු සම්පත් එක්ස්පෝ 2011 | 2011 ජුලි 8-10 | 15 |
| පුණාරක්ෂක අධ්‍යාපනය | පුණාරක්ෂබ ජාත්‍යන්තර අධ්‍යාපන ප්‍රදර්ශනය (කොළඹ) | 2011 ජුලි 9-10 | 55 |
| ශ්‍රී ලංකා ඇමරිකානු සිවිල් හමදා සබදතාවය, ශාන්තිකර විධානය | දකුණ ආසියානු සමුද්‍ර ආරක්ෂණ සමුළුව | 11-15 July 2011 | 25 |
| පුණාරක්ෂණ අධ්‍යාපනය | පුණාරක්ෂණ ජාත්‍යන්තර අධ්‍යාපන ප්‍රදර්ශනය (නුවර) | 2011 ජුලි 12 | 10 |
| NCCSL | ආයුර්වේද එක්සපෝ 2011 යෝගා, භාවනා, ආහාර සහ නිරෝගී ජාත්‍යන්තර සමුළුව සහ ප්‍රදර්ශන | 2011 ජුලි 15-17 | 150 |
| ද ටයිම්ස් ඔෆ ඉන්ඩියා | ඉන්දියානු අධ්‍යාපන එක්ස්පෝ 2011 | 2011 ජුලි 22 - 27 | 50 |
| ප්‍රමාණ සමීක්ෂණ ආයතනය ශ්‍රී ලංකාව | පැසිපික් කලාපීය ප්‍රධාන සමීක්ෂණය සමුළුව | 2011 ජුලි 22-27 | 200 |
| මොරටුව විශ්ව විද්‍යාලය | ජාත්‍යන්තර සමුළුව අධිවේගී ඉංජිනේරු ප්‍රවාහන ක්‍රම | 25-26 July 2011 | 125 |
| FAO ජල ජීවී, ජල සම්පත් මධ්‍යස්ථානය ආසියානු පැසිපික් කලාපය - ධීවර ජලජ අමාත්‍යංශය | ආසියානු කලාපිය. අමාත්‍යවරුන්ගේ සමුළුව ජලජ සම්පත් ආහාර පෝෂණය සහ ආර්ථික සංවර්ධනය. | 2011 ජුලි 26-28 | 86 |
| සාර්ක් කලාපිය වෙළඳ සංගමය | දකුණු ආසියානු කලාපිය ප්‍රවාහන සහ සංනිවේදන සම්මන්ත්‍රණය | 2011 ජුලි 28 | 15 |
| ඉංජිනේරු ආයතනය | 5 වැනි සමුළුව සාර්ක් කලාපිය ඩිප්ලෝමා ඉංජිනේරුවරුන් | 2011 ජුලි 28-31 | 60 |
| තෘතිය සහ වෘත්තිය අධ්‍යාපන ආයතනය | 1 වැනි කලාපිය සමුළුව මානව සම්පත් කාර්මික සහ වෘත්තිය අධ්‍යාපනය සහ පුහුණු | 2011 අගෝස්තු 1-3 | 36 |
| අක්ෂර වින්‍යාස කණ්ඩායම ශ්‍රී ලංකාව | ජාත්‍යන්තර සමුළුව | 2011 අගෝස්තු 5-10 | 25 |
| ශ්‍රී ලංකා හෘද රෝග සංගමය | 11 වැනි විද්‍යාත්මක සැසිය | 2011 අගෝස්තු 13-14 | 20 |

| | | | |
|---|---|---|---|
| Nu Look රක්ෂණ කණ්ඩායම | සමුළුව | 2011 අගෝස්තු 13-16 | 86 |
| ව්‍යාධි විද්‍යාව පිළිබඳව බ්‍රිතාන්‍ය ශ්‍රී ලංකා සමුළුව ජාත්‍යන්තර ව්‍යාධි විද්‍යා ආයතනය | ජාත්‍යන්තර සමුළුව | 2011 අගෝස්තු 18-20 | 35 |
| ජාතික ඉදිකිරීම් සංගමය ශ්‍රී ලංකා | ඉදිකිරීම් 2011 ප්‍රදර්ශනය | 2011 අගෝසතු 19-21 | 20 |
| SLPA | 13 වැනි සමුළුව ජාත්‍යන්තර අනුබද්ධ ශාඛා 2011 | 2011 අගෝස්තු 24-25 | 20 |
| ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ සංගමය | 5 වැනි ළමා රෝග විශේෂඥ සමුළුව | 2011 අගෝස්ත1 24-27 | 58 |
| ශ්‍රී ලංකා ආහාර සැපයුම් සංගමය | 10 වැනි ආහාර පුර්ව සැපයුම් ප්‍රදර්ශනය 2011 | 2011 අගෝස්තු 26-28 | 100 |
| වෙළඳ සංගමය | ජාත්‍යන්තර සංචරණ ආයෝජන සමුළුව | 2011 අගෝස්තු | 15 |
| SLECC | ජාත්‍යන්තර වෙළඳ සල්පිල | 201 සැප්තැම්බර් 1-5 | 150 |
| සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය | සාර්ක් කලාපීය කඳවුර / ප්‍රදර්ශනය | 3-6 September 2011 | 10 |
| ජාත්‍යන්තර රොටරි ආයතනය | රොටරි දකුණු ආසියා අපනයන සංවර්ධන සහයෝගිතා සමුළුව | 2011 සැප්තැම්බර් 4-6 | 300 |
| මොබිටෙල් | GSMA කාන්තා කාර්යය වැඩ මුළුව | 2011 සැප්තැම්බර් 7-8 | 20 |
| ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය | Facets 21 වැනි ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය | 2011 සැප්තැම්බර් 8-11 | 655 |
| ඕස්ට්‍රේලියානු නවසීලන්ත අධ්‍යාපන ප්‍රදර්ශනය | උසස් අධ්‍යාපන ඕස්ට්‍රේලියානු අධ්‍යාපන ප්‍රදර්ශනය | 2011 සැප්තැම්බර් 9 | 15 |
| IDP අධ්‍යාපනය ඕස්ට්‍රේලියාව | IDP ඕස්ට්‍රේලියානු අධ්‍යාපන කලාපය 2011 | 2011 සැප්තැම්බර් 10-11 | 25 |
| Footwork ක්‍රියාකාරකම් | 5 වැනි ජාත්‍යන්තර නර්තන තරඟාවලිය 2011 | 2011 සැප්තැම්බර් 11 | 20 |
| WSO2Con ශ්‍රී ලංකා කාර්යාලය | WSO2Con 2011 | 2011 සැප්තැම්බර් 12-16 | 30 |
| IESL සමාජ කළමනාකරණ ක්‍රියාවලිය, කොබි විශ්ව විද්‍යාලය / ජපානය | IESL-SSMS Joint ජාත්‍යන්තර සමාජ කළමනාකරණ ආයතනය 2011 | 2011 සැප්තැම්බර් 14-16 | 10 |
| නවසීලන්ත අධ්‍යාපනය | නවසීලන්ත අධ්‍යාපන සල්පිල 2011 | 2001 සැප්තැම්බර් 17 | 25 |
| මැලේසියානු මධ්‍යස්ථානය@ ජාත්‍යන්තර ශිෂ්‍යත්වලාභියා | මැලේසියානු අධ්‍යාපන ප්‍රදර්ශනය 2011 | 2011 සැප්තැම්බර් 17-18 | 20 |

| | | | |
|---|---|---|---|
| දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | 32 වැනි වාර්ෂික කාර්මික සමුළුව පොදු රාජ්‍ය මණ්ඩලය බදු පරිපාලනය | 2011 සැප්තැම්බර් 18-23 | 145 |
| ආසියානු පැසිපික් මධ්‍යස්ථානය ආර්ථික සමාජීය ආසියානු කොමිසම | ව්‍යාපාරික සමුළුව | 2011 සැප්තැම්බර් 22-23 | 30 |
| ජාතික පහර දීමේ ශ්‍රී ලාංකිය සංගමය | ආසියානු පැසිපික් පහර දීමේ සමුළුව | සැප්තැම්බර් 29 # ඔක්තෝබර් 1 2011 | 402 |
| හැටන් නැෂනල් බැංකුව | ආසියානු බැංකු කරුවන්ගේ ආයතනය 28 වැනි වාර්ෂික සමුළුව | 2011 ඔක්තෝබර් 3-4 | 200 |
| ආසියානු හෝමියෝපති වෛද්‍ය සංගමය ශ්‍රී ලංකා | 20 වැනි ආසියාන හෝමියෝපති වෛද්‍ය සමුළුව | 2011ඔක්තෝබර් 7-9 | 150 |
| PEO | අධ්‍යාපන 2011 උසස් අධ්‍යාපන ප්‍රදර්ශනය (මඩකලපුව) | 2011 ඔක්තොබර් 7-9 | 50 |
| JWT | ආසියානු පැසිපික් විධායක නිර්මාණාත්මක අධ්‍යක්ෂක මෝස්තර නිරූපණය | 2011 ඔක්තෝබර් 10-12 | 18 |
| නැගෙනහිර සහ දකුණු ආසියානු සමාජ විද්‍යා සමාජය | 10 වැනි ජාත්‍යන්තර සමුළුව | 2011 ඔක්තෝබර් 10-13 | 107 |
| ජාතික භාෂා සහ සමාජ අධ්‍යයනය බ්‍රිතාන්‍ය ශ්‍රී ලංකා කවුන්සිලය | 9 වැනි ජාත්‍යන්තර භාෂා සංවර්ධන සමුළුව භාෂා සමාජ තෝරා ගැනීම | 2011 ඔක්.තෝබර් 17-19 | 30 |
| PEO | අධ්‍යපන 2011 උසස් අධ්‍යාපන අමාත්‍යංශය (කොළඹ) | 2011 ඔක්තෝබර් 21-23 | 50 |
| සෞඛ්‍ය අමාත්‍යංශය | 10 වැනි ඇස්කොන් සමුළුව | 2011 ඔක්තෝබර් 21-23 | 40 |
| සර් ආතර් සී ක්ලාර්ක් නවීන තාක්ෂණ මධ්‍යස්ථානය | 15 වන සමුළුව රාජ්‍ය උපදේශක සභාය UNESCAP ප්‍රාදේශිය අයදුම්පත්‍ර වැඩ සටහන් ස්ථිරසාර සංවර්ධනය සඳහා | 2011 ඔක්තෝබර් 25-27 | 23 |
| සර් ආතර් සී ක්ලාර්ක් නවීන තාක්ෂණ මධ්‍යස්ථානය | උපදේශක රැස්වීම ප්‍රාදේශිය යන්ත්‍රණය විශේෂ ආපදා කළමනාකරණ ස්ථිරසාර සංවර්ධනය | 2011 ඔක්තෝබර් 25-27 | 23 |
| PEO | හෝටල්, ආගන්තුක සත්කාර්ය ශ්‍රී ලංකාව | 2011 ඔක්තෝබර් 27-29 | 120 |
| ශ්‍රී ලංකා විකලාංග සංගමය | වාර්ෂික අධ්‍යයන සැසිය 2011 | 2011 ඔක්තෝබර් 28-30 | 10 |
| කොළඹ Hash නිවස | 4 වැනි දකුණු ආසියානු තරඟය | 2011 ඔක්තෝබර් 28-31 | 200 |
| සාර්ක් කලාපීය තොරතුරු මධ්‍යස්ථානය | සාර්ක් සම්මන්ත්‍රණය මාධ්‍යයේ කාර්යය භාරය සංචාරක ප්‍රවර්ධනය උදෙසා | 2011 නොවැම්බර් 13 | 10 |
| ශ්‍රී ලංකා සමාජ හදිසි අවස්ථා වෛද්‍ය රැකවරණය | වාර්ෂික විද්‍යාත්මක සැසිය 2011 | 2011 නොවැම්බර් 13-16 | 10 |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා නාවික හමුදාව | ගාලු සංවාදය 2011 ජාත්‍යන්තර නාවුක සමුළුව | 2011 නොවැම්බර් 14-15 | 40 |
| ශ්‍රී ලංකා මෝස්තර උත්සවය | දකුණු ආසයානු ඇඳුම් මෝස්තර තරඟාවලිය | 2011 නොවැම්බර් 18 | 20 |
| KPMG ශ්‍රී ලංකා | 10 වැනි මැදපෙරදිග දකුණු ආසියානු හවුල්කාර සමුළුව | 2011 නොවැම්බර් 21-22 | 100 |
| අමානා ටකාපුල් පුද්ගලික සමාගම | 4 වැනි ICMIF තකාපුල් ජාල සම්මන්ත්‍රණය | 2011 නොවැම්බර් 22-23 | 35 |
| මෙඩිසිනා ඕල්ටර්නේටිව් ජාත්‍යන්තර සමාගම | Medicina Alternativa | 2011 නොවැම්බර් 25 | 460 |
| ශ්‍රී ලංකා ස්නායු වෛද්‍යවරුන්ගේ සංගමය | පුර්ව අධ්‍යාපන වැඩ මුළුව | 2011 දෙසැම්බර් 2 | 30 |
| ශ්‍රී ලංකා ස්නායු ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමය | 5 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය | 2011 දෙසැම්බර් 3-4 | 16 |
| ශ්‍රී ලංකා මනෝ විද්‍යා උපදේශක ආයතනය | ජාත්‍යන්තර මනෝ විද්‍යා පිළිබඳ සමුළුව | 2011 දෙසැම්බර් 5-8 | 103 |
| ශ්‍රී ලාංකිය කාන්තා හඩ | ස්ත්‍රී මේලා ප්‍රදර්ශනය සහ සමුළුව | 2011 දෙසැම්බර් 8-10 | 10 |
| ඉංජිනේරු පීඨ පේරාදෙණිය, මොරටුව, මෙල්බෝර්න් | ජාත්‍යන්තර සමුළුව ඉංජිනේරු කොන්ත්‍රාත් කාර්යයන් කළමනාකරණය 2011 | 2011 දෙසැම්බර් 16-18 | 35 |
| මැණික් විද්‍යාඥයින්ගේ සංගමය | $Jewels SL 201 ජාත්‍යන්තර මැණික් පතල්, රත්‍රං කර්මාන්තය වෙළඳ ප්‍රදර්ශනය | 2011 දෙසැම්බර් 17-18 | 20 |
| දේශිය වෛද්‍ය ආයතනය, විශ්ව විද්‍යාලය කොළඹ | ආයු මෙඩිකා ආයුර්වේදිය වෛද්‍ය ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර සමුළුව සහ වෛද්‍ය යන්ත්‍ර, ආශ්‍රිත බෙහෙත් පැලෑටි සහ හරිත නිෂ්පාදන | 2011 දෙසැම්බ් 19-22 | 191 |
| ව්‍යවහාරික සංඛ්‍යාන දත්ත සමුහය, ශ්‍රී ලංකාව | ජාත්‍යන්තර සංඛ්‍යාන සමුළුව 2011 | 2011 දෙසැම්බර් 28-30 | 150 |

2.3 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ සංචාරක ක්ෂෙත්‍රයේ ආයතන වලට බලපත්‍ර ලබා දීමට අවශ්‍ය සංරචකයින් නිර්මානය කිරීමටද සහය දක්වන ලදී.

2.4 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ශ්‍රී ලංකා වෘත්තිය සමුළු සහ ප්‍රදර්ශන සංවිධායක වරුන් සමග ඉතා සමිපව කටයුතු කරමින් ඔවුනට අවශ්‍ය උපදෙස් දීම සහ මෙම උත්සව කාර්යය ශ්‍රිතයන් ප්‍රවර්ධනය කිරීමට සහ ඒ තුලින් MICE සංචරණය වර්ධනය කරලීමට සහාය වේ.




සංචාරක උදාවට දැක් වු සහාය

2.5 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ව්‍යාපාරික ජාත්‍යන්තර සඟරා ආයතනයට සහ එම ආයතන සංචාරක ක්ෂෙත්‍රයේ ආයතනය සමග සමීපව කටයුතු කිරීමටත් සහය දේ. ඒ අනුව චාරිකා ක්ෂෙත්‍ර සම්බන්ධ විසතර ලබා දීමටත් ජංගම දුරකථන ජාල මගින් ව්‍යාපාරික තොරතුරු ලබා දීමටත් සහය වී ඇත.



2.6 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ඉන්දියානු ආයෝජකයින් සමග සමීපව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා ඇති කර ලීමටත් කටයුතු කර ඇත. උදාහරණ වශයෙන් ඉන්දියානු ආයෝජන ලොකේෂ් ෂබාරවා මහතා, උප සභාපති Accor සමූහය, ඉන්දියානු සමාගම් සමග සාකච්ඡා කර ඇත.

## 3. නිෂ්පාදිත සංවර්ධනය

3.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය නාගරික සංවර්ධන අධිකාරියෙහි නිලධාරීන් සමග සමීපව කටයුතු කරමින් හම්බන්තොට සම්මුති මධ්‍යස්ථානය මෙම වසරේ විවෘත කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.



හම්බන්තොට සම්මුත මධ්‍යස්ථානය

3.2 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශ්‍ය යාපනයෙහි අරාලේ ඉදිකරන සම්මුති මධ්‍යස්ථානයෙහි සැලසුම් සහ ඉඩම් වෙන් කරවා ගැනීමටද කටයුතු කර ඇත.

3.3 කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව නව පිහිටීමකට ඇතුලත් කර අලෙවි කිරීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය උපදෙස් දී ඇත.

මිහිලක් මැදුර



3.4 කලා මධ්‍යස්ථාන ප්‍රවර්ධනය - ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය කලා මධ්‍යස්ථානයන් ප්‍රවර්ධනය කිරීමටද අනාගතයේදී සැලසුම් කර ඇත.



3.5 විවිධ අවශ්‍යතා සඳහා සම්මුති මධ්‍යස්ථානයන් සැලසුම් කිරීමට මහා භාණ්ඩාගාරය විසින් පත් කරන ලද කමිටු සාමාජිකයන් ලෙසද සම්මුති කාර්යංශය කටයුතු කර ඇත.

3.6 ජෙට්ලයිනර් නෞකාව තුලින් ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ශ්‍රී ලංකා නාවික හමුදාව සමග මෙහෙයුම් කටයුතු වලට සම්බන්ධ වෙයි. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ජෙට්ලයිනර් නෞකාව නව වෙළඳ නාමයක් යටතේ අලෙවි කිරීමටද සහාය පල කරයි.





3.7 හම්බන්තොට සංවර්ධන උපාය මාර්ග ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධන උපාය මාර්ගික සැලසුම් කිරීම සඳහා ආයෝජකයින්ට මග පෙන්වීමට අවශ්‍ය තොරතුරු ඔවුන්ට ලබා දීමට කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය අදාල ව්‍යාපෘතිය සම්බන්ධව උපදේශකයින් දෙදෙනකු ලබා එහි සැලසුම් අදාල විස්තර අඩංගු කර පොතක් මුද්‍රණය කර ඇත.



3.8 හම්බන්තොට ආයෝජන පත්‍රිකාව - ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය උපදේශකයින් ලවා ආයෝජනය සැලසුම් පත්‍රිකාවක් නිර්මාණය කර ආයෝජකයින් අතට පත් කර ඇත.




3.9 රාමායනය කථා වස්තුවට සහය දැක්වීම - ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය රාමායනය සංචාරකයින් අතර ජනප්‍රිය කර ලීම සඳහා වැඩ මුළු අධ්‍යන චාරිකා පවත්වා ඇත.





# 4. පර්යේෂණ

4.1 දත්ත පද්ධතිය - සම්මුති කාර්යංශය විසින් විවිධ වු දත්ත 5700 කට වඩා වැඩි ප්‍රමානයක් අන්තර්ගත කර ගොඩ නංවා ඇත. 2011 වර්ෂයේ මෙම දත්ත පද්ධතියට 355 ක් වු නව දත්ත ඇතුලත් කරන ලදි.

4.2 සම්මුති කාර්යංශය අඛණ්ඩව ව්‍යාපාරික ප්‍රජාව සමග සම්බන්ධතා පවත්වා ගනි.

4.3 සම්මුති කාර්යංශය විසින් ජාත්‍යන්තර සම්මුති සංගමය (ICCA) සමග තම සාමාජිකත්වය 2011 වසරේද ගෙන ඇත. ඒ අනුව එහි ප්‍රතිලාභයන් සම්මුති කාර්යංශය අත්පත් කර ගෙන ඇත.

# 5. පුහුණුව

5.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයෙහි 09 වැනි වෘත්තීමය සංවර්ධන වැඩ සටහන 2011 වර්ෂයේදී වත්තල පෙගාසස් රීෆ හෝටලයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් 09 වැනි MICE වෘත්තීමය සංවර්ධන වැඩ සටහන සාර්ථකව පවත්වන ලදී. මෙහි මාතෘකා තේමාව වුයේ පරිසරික රැස්වීම් වැඩි ලාභදායකත්වයක් ගනි යන්නයි. මෙම වැඩ සටහන 2011 ජුනි 23 # 25 දක්වා වත්තල පෙගාසිස් රීෆ හෝටලයේදි පවත්වන ලදී. බොහෝ පිරිසක් සහභාගී වුනු මෙම වැඩ සටහන තුල පාරිසරික රැස්වීම් කර්මාන්තය තුල බොහෝ ප්‍රශ්න නිරාකරණය වන බව සනාථ විය. විවිධ ජාත්‍යන්තර සහ දේශිය පරිසරාත්මක සංවිධාන මෙම වැඩ මුළුවට සහභාගී වී රට තුල ඇති ස්වාභාවික සම්පත් භාවිතා කිරීම ඒවා තුලින් සංවර්ධනය කරා පිය නගන්නේ කෙසේද යන්න හඳුන්වා ඇත.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ශ්‍රී ලංකාව සමුළු, රැස්වීම්, දිරි ගැන්වීම් පැවැත්වීමේ පුහුණු ස්ථානයන් ලෙස ප්‍රවර්ධනය සිදු කෙරේ. ඒ ' අනුව මේ සම්බන්ධ නේවාසික වැඩ සටහන් පවත්වන ලද අතර ඒ සඳහා MICE සංචාරක කර්මාන්තයේ ජාත්‍යන්තර විශේෂඥයෙක් වු ඇන්තනී වෝන්ග් මහතා විලියම් ටියෝ මහතා සහ මැලේසියාවේ එස්. සෙල්වදුරෙයි යන මහත්වරුන් සහභාගි වුණ.

හිරාන් කුරේ මහතා, සභාපති පාටා සංවිධානය, ආචාර්ය ජනක විජේසුන්දර, ජේෂ්ඨ කථිකාචාර්ය මොරටුව විශ්ව විද්‍යාලය, සේන සේනාරත්න මහතා කළමනාකාර අධ්‍යක්ෂ යාත්‍රා ට්‍රැවල්ස් සහ සුනෙත් ශාන්තසිංහ මහතා, ව්‍යාපෘති කළමනාකාර අයි. සි. සී. ශ්‍රී ලංකීය සභාව ලෙස සහභාගී විය.

ආචාර්ය නාලක ගොඩහේවා, සභාපති ශ්‍රී ලංකා සංචරණය ශ්‍රී ලාංකීය සංචරනයේ සමස්ථ උපාය මාර්ගික සැලැස්ම තුල MICE සංචරණයේ කාර්යය භාරය විස්තරාත්මකව පැහැදිලි කරන ලදී.

මෙම පුහුණු සැසිය ශ්‍රී ලාංකිය සංචාරක කර්මාන්තයේ MICE සංචරණ කර්මාන්තයේ නියැලී සිටින වෘත්තීමය සමුළු / ප්‍රදර්ශන සංවිධායකයින් දේශාන්තර කළමනාකරණ සමාගම් වලට, හෝටල්, එයාර් ලයින් සේවා ජාතික සංචාරක මාර්ගෝපදේශකයන් හට සමුළු වලට, ප්‍රදර්ශන මධ්‍යස්ථාන හිමියන්ට සහ චාරිකා මෙහෙයුම් කරුවන්ට යනාදී වශයෙන් විවිධ ක්ෂෙත්‍ර වලින් 40 කට වැඩි පිරිසක් සහභාගී විය.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ වෘත්තීමය සංවර්ධන වැඩ සටහන යටතේ MICE සංචාරක කර්මාන්තය සඳහා දේශාන්තර කළමනාකරණය, හරිත රැස්වීම්, හරිත නිර්මාණ, පරිසර හිතකාමී හෝටල් කර්මාන්තය, පරිසර හිතකාමී වාස්තු විද්‍යාව, හරිත වේදිකා නිර්මාණය, ප්‍රදර්ශන නිර්මාණය, දිරිගැන්වීමේ චාරිකා, ව්‍යවසායකයන්, නායකත්ව වැඩ මුළු, අනුග්‍රාහකත්වය, සමුළු තාක්ෂණ වැඩ සටහන් ඇතුලත් වන අතර එම වැඩ සටහන් සම්බන්ධිත පාර්ශව කරුවන් සමගද සාකච්ජා කර ඇත.



# 6. ප්‍රවර්ධනය

## 6.1 ජාත්‍යන්තර මාධ්‍ය මගින් ප්‍රසිද්ධිය ලබා දීම

6.1.1 සිංගප්පූරුවේ බොන්වෝ මැගසනිය මගින් ශ්‍රී ලාංකීය MICE සංචරණයේ පත්‍රිකා 10,000 ක් පිටපත් සමග ලෝක ජාල පද්ධතිය වෙත බෙදා හැර ඇත.




6.1.2 ලාංකියන් සඟරාව




6.1.3 Things To Do සඟරාව




6.1.4 Kompass සඟරාව




6.1.5 MIM ප්‍රධාන කාර්යාලීය සඟරාව



# Sri Lanka to promote tourism in northeast

NT Bureau
Chennai, Nov 24:

With the end of ethnic conflict in the north-east, the Sri Lankan government has taken a number of efforts to boost tourism in the former war zones following an increase in the arrival of foreign travellers.

'The government has relaxed travel restrictions to the northern areas while the east has already opened up. Visitors are encouraged to come, though infrastructure is not yet in place in the north and east. Tourism infrastructure projects are planned as public-private partnerships in these regions,' said Vipula Wanigaseker, general manager of Sri Lanka Convention Bureau (SLCB) at a promotion campaign held recently in Chennai. During a 'Meet in Sri Lanka' campaign, top officials of SLCB, SriLankan Holidays and representatives from the hospitality industry were part of the delegation from Colombo that have come here to promote MICE (meetings, incentives, conferences, exhibitions) tourism. 'A couple of Indian companies too have shown interest in some of the projects,' said Wanigaseker.

The Sri Lanka Tourism Development Authority (SLTDA) has launched the Eastern Region Development project under which resorts and hotels and other facilities wou[ld] be revived and developed in diffe[r]ent spots identified along the eas[t]ern coast. Wanigaseker said th[at] several tourism projects and airp[ort] development to improve domestic connectivity were being taken up [to] attract leisure travellers and MIC[E] travellers. 'We are also promoting th[e] Ramayana trail. Of the 56 Ramaya[na] sites, 14 are accessible. Alrea[dy] 5,000 visitors have come to the[se] sites from India,' he said.

SriLankan Holidays sales manag[er] Shyana Wijayaratne pointed out [In]dia was the prime market for MIC[E] tourism in the island nation. 'We hav[e] introduced special 'Meet in Sri Lank[a]' packages to meet the target of 35,0[00] MICE arrivals next year. Around 1,0[00] people had travelled from Chen[nai] alone,' he said.

*Sri Lanka Convention Bureau general manager Vipula Wanigaseker speaking at a campaign in Chennai recently to boost tourism in the island nation. Also seen are SriLankan Holidays sales manager Shyana Wijayaratne and other officials.*



# శ్రీలంక ఫుడ్ ఫెస్టివల్ ప్రారంభం

6.1.6 **බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා කළමනාකරණය ඉදිරිපත් කර HQ සඟරාව චාරිකා ඉදිරිපත් කිරීම මාෂල් විෂර්ස්**




6.1.7 **වොයේජස් උපාය මාර්ගික කළමනාකරණ මැගසිනය මගින් ශ්‍රී ලංකාවේ** MICE **සංචාරක පහසුකම් පිළිබඳ තොරතුරු ලබා දී ඇත.**

6.1.8 **ඉන්දියාවේ එල්. බී. ඇසෝසියේට් විසින් ශ්‍රී ලංකාවේ** coffee table **නැමැති පොත ප්‍රසිද්ධ කර ඇත.**

## 6.2 ප්‍රවර්ධන අමුද්‍රව්‍ය

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය පහත සඳහන් ප්‍රවර්ධන ද්‍රව්‍ය පිළියෙල කර ඇත.

- සම්මුති සංයුතිය
- සම්මුති සංයුතියෙහි මුද්‍රිතය
- MICE චිත්‍රපට # විවිධ මාදිලියෙන් නිෂ්පාදනය කර ඇත
- MICE චිත්‍රපටය - මීගමුව
- දිරිගැන්වීමේ පත්‍රිකාව
- විවධ ක්‍රියාකාරකම්හි සංචරන පත්‍රිකා
- රැස්වීම් සැලසුම්
- සම්මුති ප්‍රදාන
- ජෙට්ලයිනර් නෞකාව ප්‍රවර්ධන පත්‍රිකාව - නව

## 6.3 රට හඳුනා ගැනීමේ චාරිකාව

MIM සඟරාවේ සංවිධායක හා ප්‍රධාන කතෘ HQ සඟරාව - යුරෝපය රට හඳුනා ගැනීමේ චාරිකාවක් සංවිධානය කරන ලදී



MIM ප්‍රධාන කතෘතුමා මාෂල් විෂර්ස්

## 6.4 MICE සල්පිල් වලට සහභාගි විම

### 6.4.1 2011 මැයි මස පවත්වන ලද IMEX සල්පිලට සහභාගී වන ලදී.

IMEX සල්පිල ජාත්‍යන්තර MICE සංචරන සල්පිලකි. සංචාරක කර්මාන්තය පවත්වන ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස මෙය හැදින්විය හැක. සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට මෙය බෙහෙවින් ඉවහල් වේ. මෙම වසරේ මෙම සල්පිලට 1500 ක පමන ප්‍රදර්ශකයින් සහ 150 ක මන රටවල් සහභාගී වන ලදී. දින 03 ක් පුරා පැවති මෙම සල්පිල ගැනුම් කරුවන් 3900 ක් පමන සහභාගී වු අතර සමස්ථ සහභාගි වු සංඛ්‍යාව 9000 කි.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ සමස්ථ අලෙවිකරණ සැලසුම අනුව 09 වැනි වසරටත් මෙම සල්පිලට ඉදිරිපත් කරන ලදී. මෙම පොත් ෆැන්ක්ෆර්ට් නුවර 2011 මැයි 24 සිට 26 දක්වා අලෙවියට සුදැනම් කර තිබුණි. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය සඳහා වර්ග මීටර් 24 ක ඉඩමක් මෙම සල්පිලේදි වෙන් විය. මෙම වසරේදී සංචාරක කර්මාන්තයේ සාමාජකයින් 09 දෙනෙකු මෙයට සහභාගී විය.




**ශ්‍රී ලාංකිය දූත කණ්ඩායම ව්‍යාපාරික සැසිය තුල**

**අරමුණු**

ජර්මනියෙහි අධික වියදම් දරන MICE සංචරන සම්මුති සමාගම් සිටී. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය IMEX ප්‍රදර්ශනයට සහභාගී වීම තුලින් MICE සංචරනය සම්බන්ධිත පාර්ශවයන් ශ්‍රී ලංකාව තුල ව්‍යාපාරික කටයුතු වල නියැලිමට විශේෂ වැඩ පිලිවෙලක් යොදන ලදී.

**ඉලක්ක ලඟා කර ගැනිම්**

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් දිරි ගැන්වීමේ චාරිකා වල නිරත ජර්මන් ව්‍යාපාරික ප්‍රජාව මෙරටට විශාල වශයෙන් ගෙන්වන ලදී. කාර්යංශය පහත සඳහන් ව්‍යාපාරික ප්‍රජාව මුණ ගැස්සවීම සිදු කරන ලදී.

| **ඒජන්ත / සංගමයේ නම** | **සංඛ්‍යාන** | **වසර** | **රට** |
|---|---|---|---|
| කෙනෙසාසියා | 800-1000 | 2012 | ජාත්‍යන්තර |
| ස්පෝර්ට් ව්‍යාපාර | 600-800 | 2014 | ජාත්‍යන්තර |
| ජාත්‍යන්තර සමාජ | 300-600 | 2014 | ජාත්‍යන්තර |
| ජාත්‍යන්තර මූල්‍ය ජායාරූප සංගමය | තවම තීරණය කර නොමැත. | 2013-2014 | ජාත්‍යන්තර |

ඉහත ව්‍යාපාරික ප්‍රජාවට අමතරව ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය පුද්ගලික හමුවීම් 30 ක් සහ කණ්ඩායම් 06 ක් ජර්මනියේදී මුණ ගැසෙන ලදී. ඩුබායි, ඕස්ට්‍රේලියාව, සවුදි අරාබිය, රුසියාව රටවල කණ්ඩායම් 6-14 සාමාජික කණ්ඩායම්ද මුණ ගැසෙන ලදී.



**අනාගත පසු විපරම් ක්‍රියාමාර්ග**

විදේශ ව්‍යාපාරික ප්‍රජාව ශ්‍රී ලංකාව MICE සංචාරක දේශාන්තයක් බවට ප්‍රවර්ධනය කිරීමේ විවිධ වැඩ සටහන් කාර්යංශය දියත් කර ඇත. එනම් විවිධ වු ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් මාධ්‍ය ප්‍රාදේශීය චාරිකා වැඩ සටහන් සංවිධානය කරමින් ඉතා මිල අඩු සංචාරක ගාස්තු පවතින දේශාන්තයක් ලෙස හඳුන්වා ඇත.

ජාත්‍යන්තර සම්මුතින් හට ශ්‍රී ලංකාව MICE දේශාන්තයක් ලෙස හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ උපාය මාර්ගික සැලසුම අනුව ජර්මනියේ දිරි ගැන්වීම් සංචරනය ලෙස සමස්ථ වෙළඳ පලෙන් 10% ක ප්‍රමානයක් අවම වශයෙන් මෙරටට ගෙන ඒමට උත්සාහ දරා ඇත. ඒ සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් MICE ව්‍යාපාරික ගනුදෙනු ශ්‍රී ලංකාව සහ ජර්මනිය අතර ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය බොහෝ දුරට සිදු කර ඇත.

**නිර්දේශයන්**

පහත සඳහන් පහසුකම් කර්මාන්තයේ සාමාජිකයන් හට IMEX වෙළඳ සල්පිල හරහා සිදු කෙරුණි.

- ශ්‍රී ලංකාව ප්‍රවර්ධනයට වෙන් කිරීම තුල සාමාජිකයන්ට තම ප්‍රවර්ධන කටයුතු වල යෙදීමට අවස්ථාව ලබා දිම සංචාරක කර්මාන්ත සාමාජිකයින් 09 ක් නියෝජනය කරමින් සමාගම් 3 - 4 ක් සහභාගී වීම.
- කණ්ඩායම් හමුවීම සඳහා වෙන් වු කලාපයක් නම් කිරීම
- ගැණුම් කරුවන් රාශියක් මුණ ගැස්වීම
- සියළුම අමුත්තන් සඳහා ශ්‍රී ලාංකීය තේ ලබා දීම.
- ශ්‍රී ලාංකිය මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය
- ශ්‍රී ලාංකීය ආයුර්වේද ක්‍රමය ස්පා පාද / හිස ස්පර්ශය ජර්මානුවන් අතර ප්‍රසිද්ධ කිරීම

### 6.4.2 IT සහ CMA සල්පිල්

මෙය තුන්දින MICE සංචාරක සල්පිලකි. මේ සඳහාද කර්මාන්ත සාමාජිකයින් අතර බොහෝ ඉල්ලීම් ලැබුනි. MICE සංචරනය ප්‍රසිද්ධ කිරීමේ ප්‍රධාන සල්පිලක් ලෙස මෙය හැඳින්විය හැක. කර්මාන්ත සාමාජිකයින් 120 දෙනෙකු පමන හමුවීම් සිදුවුනු අතර මෙම සල්පිලට ශ්‍රී ලන්කන් එයාර් ලයින්, ලංකා ස්පෝර්ට් රයිසන්, NKAR ට්‍රැවල්ස්, ලංකා ප්‍රදර්ශන සම්මන්ත්‍රණ සේවාව තම ව්‍යාපාරික කටයුතු මෙම සල්පිල තුලින් තහවුරු කරනු ලැබිය.



ශ්‍රී ලාංකීය දුත කණ්ඩායම ව්‍යාපාරික හමුව



මාධ්‍ය සාකච්ජාවට සහභාගී වු අයගෙන් කොටසක්

6.4.3 MICE ප්‍රවර්ධන / පකිස්ථානය

පකිස්ථානයේ කරච්චි නුවර අරච් හෝටලයේ පැවැති සංචාරක කර්මාන්තයේ සාමාජිකයින් 08 දෙනෙකු පමණ සහභාගි වු ශ්‍රී ලන්කන් එයාර් ලයින් සංවිධානය කරන ලද MICE සංචාරක වැඩ සටහනට කාර්යංශය සහභාගි විය. මෙහිදී මාධ්‍ය සාකච්ජා සන්ධ්‍යා ඉදිරිපත් කිරීම, රැස්වීම් පවත්වන ලදී. මෙහිදී කණ්ඩායම් 03 ක් 2012 වසරෙහි පළමු මාස 3 තුළ 300 MICE සංචාරකයින්ගේ සහභාගී වීම තහවුරු කරන ලදී.

6.4.4 GIBTM 2012, IMEX 2012 සඳහා කාර්යයන් සම්පාදනය කරන ලදී.

6.4.5 ශ්‍රී ලන්කන් එයාර් ලයින් සහ මුම්බායි ඉන්දියාව අතර ප්‍රවර්ධන වැඩ සටහන් කාර්යංශය සංවිධානය කරන ලදී.

## 6.5 MICE ප්‍රවර්ධනය / ඉන්දියාව

6.5.1 ඉන්දියානු සම්මුති කණ්ඩායම් 30 දෙනෙකු පමණ පසු ගිය වසර තුළ ශ්‍රී ලංකාවේ රැස්වීම් පවත්වන ලදී. එනම් ටාටා ඇසෙස්ට්ස් කළමනාකරණය, TUI කොචින්, කෙමෙක්ස් SAP සහ ගල්ෆ කලාපිය ඕට්ස් සංවිධානය මේ අතර වේ.

6.5.2 2012 ඉන්දියාවේ පවත්වන ශ්‍රී ලන්කන් එයාර් ලයින් ප්‍රවර්ධන වැඩ සටහන් සාකච්ජා කර ඇත.

## 6.6 වෙබ් අඩවි ප්‍රවර්ධනයන්

6.6.1 වෙබ් අඩවිය වු www.visitsrilana.net දෛනිකව යාවත්කාලින කර ඇත.

6.6.2 ආර්ථික සංවර්ධන අමාත්‍යංශයෙහි වෙබ් අඩවිය ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය වෙබ් පිටුව සිංහල භාෂාවෙන්ද අනුයුක්ත කරන ලදී

6.6.3 BBT වෙබ් පිටුව යාවත්කාලින කර ඇත.

6.6.4 MICE සංචාරක කාර්යයන් වෙබ් අඩවි යාවත්කාලින කර ඇත.

6.6.5 මාධ්‍ය සඟරා වෙබ් අඩවිය

http://www.businessglobal.com/flash/exhibition.php?Eid=6



6.6.6 TTG Asia (www.ttgasia.com)

6.6.7 වාර්ෂික සංචරණ නාමාවලිය ප්‍රකාශය තුල ඕස්ට්‍රේලියාවද යාවත්කාලින කර ඇත.




## 6.7 MICE සංචාරක සාමාජකයන්ට පැවැත් වූ සැසිවාරයන්

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය MICE සංචරණ කර්මාන්තයේ සාමාජකයන් සඳහා සාකච්ජා විදේශ ප්‍රවර්ධන වැඩ සටහන් 2014 දී පැවැත්විම පිළිබඳව අලෙවි සැලසුමේ අන්තරගතව ඇත. ශ්‍රී ලංකා සම්මුති කාර්යයන් අලෙවි සැලසුම සාමාජකයන්ගේ අදහස් මත සකස් කර ඇත.



# 7. අනෙකුත් ක්‍රියාකාරකම්

7.1 ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ උපදෙස් අනුව සහ ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයෙහි සභාපතිතුමාගේ මහ පෙන්වීම අනුව ශ්‍රී ලාංකිය සම්ප්‍රදායික නර්තන ශිල්පිය ක්‍රියාකාරකම් සංචාරකයින්ට ප්‍රදර්ශනය කිරීමට වැඩ සටහනක් Feel Sri Lanka නමින් කාර්යංශය ආරම්භ කරන ලදී. ඒ අනුව සැම සතියකම සිකුරාදා සවස හෝටල් පාසල් ශ්‍රවනාගාරයේදී මෙම ප්‍රසංගය සංචාරකයින් හට ප්‍රදර්ශනය කරන ලද අතර සංදර්ශන 25 ක් 2011 වසරේදි පවත්වන ලදී.





7. 2 ස්ථිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ලෝක බැංකුවත් සමග මෙම ව්‍යාපෘතිය පවත්වා ගෙන යයි. 2010 ඔක්තෝබර් 17-26 සිට එහි 2011 වසරේ පළමු කාර්තුව දක්වා එය පැවැත්වුණ.

7.3 පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලිය 2018 හම්බන්තොට

ශ්‍රී ලංකා සංචරණයේ සභාපති තුමා සහ කළමනාකාරක අධ්‍යක්ෂ මෙම තරග සංවිධානය කිරීමේ මිල විමසුම සහ මාධ්‍ය කරුවන්ගේ නවාතැන් සංවිධායක කමිටුව සඳහා පත් කරන ලදී. මෙම සංවිධායක කමිටුව හම්බන්තොට පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගයන් මිල විමසුම සඳහා වගකීම් පාර්ශවය විය. මෙහි වැඩ කාර්යයන් ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නුවරදී සිදු කරන ලදි. කාර්යංශයේ සාමාන්‍යාධිකාරී මෙම වැඩ කාර්යයන් සඳහා සහභාගී වුණ අතර මේ සඳහා මිල විමසම කර ඇත්තේ ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව වේ.

7.4 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය නේපාලයේ කත්මන්ඩු නුවර 2011 ජනවාරි පැවත්වනු ලැබු සාර්ක් කලාපීය සංචාරක අමාත්‍යවරුන්ගේ සමුළුව සංවිධානය කරන ලදි.




7.5 2011 ඔක්තෝබර් මස පැවැති දකුණු ආසියාතික වෙරල ක්‍රීඩා තරගාවලිය හම්බන්තොට පැවැත්වීම. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය කටයුතු යොදන ලදී.




*Venue*




ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය මෙම තරඟාවලියට නිර්මාණය කරන ලද මතක සටහන්




තරඟාවලියේ ජයග්‍රාහකයින්ට ලබා දුන් සහතිකය




ප්‍රකාශන

7.6 ලෝක සංචාරක දිනය 2011 වසර වෙනුවෙන් සමරු මුද්දර (නව) 10 ක් ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය නිකුත් කරන ලදී. මෙය තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යංශයත් සමග ඒකාබද්ධව සිදු කරන ලදී. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය මෙම මුද්දර නිර්මාණය කරන ලදී.





සංචාරක තේමා 08 ක් යටතේ නිර්මාණය වු මුද්දර 10

ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මුල් දින කවරය පිළගැන්වීම.

7.7 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය විසින් ලෝක උරුම ව්‍යාපෘති සඳහා සංචරණය නැමති වාර්තාවක් සම්පාදනය කරන ලදී.

7.8 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ සාමාන්‍යාධිකාරී සහ අලෙවි කළමනාකාර හම්බන්තොට සම්මුති මධ්‍යස්ථානය ඉදිකිරීම් නිරීක්ෂණය



7.9 ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය ඉලෙක්ට්‍රොනික් චාරිකා වැඩ සටහනක් ආගමන සහ විගමන දෙපාර්තමේන්තුවත් සමග සංවිධානය කරන ලදී.





ආගමන විගමන අධ්‍යක්ෂ ජනරාල් චුලානන්ද පෙරේරා මහතා මෙම වැඩ මුළුව ඇමතීම





*නිල වෙබ් අඩවිය එළි දැක්වීම - [www.eta.gov.lk](http://www.eta.gov.lk)*

# 8. මූල්‍ය සහ පරිපාලනය

8.1 අදාල අවශ්‍යතා අනුව සම්මුති කාර්යංශය මහින්ද චින්තන වැඩ සටහන යටතේ කාර්යය සාධන වැඩ සටහන් වාර්තාවක් 2011 වසරට සකස් කරන ලදි. මෙහිදි ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාකාරකම් වාර්තා සකස් කර ඉදිරිපත් කරන ලදි.

8.2 විගණන විමසුම සඳහා පිළතුරු වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශයට ඉදිරිපත් කරන ලදි.

8. 3 වර්තමාන කාර්යය මණ්ඩලය

| | | |
|---|---|---|
| ආචාර්ය නාලක ගොඩහේවා මහතා | - | සභාපති |
| විපුල වනිගසේකර මහතා | - | සාමාන්‍යාධිකාරී |
| අචිනි දන්දුනුගේ මිය | - | ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, පරිපාලන මෙහෙයුම් |
| කුමුදු හෙන්නදිගේ මිය | - | අලෙවි කළමනාකාරිනී |
| උපාලි සිල්වා මහතා | - | අධ්‍යක්ෂ / ක්‍රියාකාරකම් |
| රන්ජිකා පෙරේරා මිය | - | සහකාර කළමනාකාරිනී, ගිණුම් සහ පාලනMs |
| පියුමි පෙරේරා මෙනවිය | - | සහකාර කළමනාකාරිනී, පර්යේෂණ සහ පුහුණු |
| උදාර රන්බණ්ඩාර මහතා | - | කළමනාකරණ සහකාර |
| සගන්දි දොඩන්වත්ත මෙනවිය | - | ලේකම් |
| ශාලිකා තලගල මෙනවිය | - | ලේකම් / සම්බන්ධීකාරක |
| සංජීව පෙරේරා මහතා | - | රියදුරු |

8.4 ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමග ගිවිසුම - සම්මුති කාර්යංශය
2011 වසරේ ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගම සමග රුපියල් මිලියන 2 ක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් ගුවන් ටිකට් පත් ගිවිසුම පවත්වා ගෙන යන ලදී.

8.5 2011 මාර්තු මස සිට සම්මුති කාර්යංශයේ සාමාන්‍යාධිකාරී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ලෙසද පත් කරන ලදී.

**විපුල වනිගසේකර**
**සාමාන්‍යාධිකාරී**

# ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය

´Ù] ûæ$Áù

2011

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
## ගිණුම්වලට අදාල සටහන්
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**1. සංස්ථාපිත තොරතුරු**

1.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 2005 අංක 38 දරණ සංචාරක පනතෙන් ස්ථාපිත ආයතනයකි. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරික කටයුතු කරන ස්ථානය නො. 78, ගාලුපාර, කොළඹ 03 ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 04 වැනි මහලේ පිහිටා ඇත.

1.2 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ශ්‍රී ලංකාවේ සමුළු පැවැත්වීම, රැස්වීම් පැවැත්වීම, දිරි ගැන්වීම්, චාරිකා හා ප්‍රදර්ශන පැවැත්වීම් මූලික අරමුණ ඇතිව පිහිටා ඇත.

**2 ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය**

**2.1 ගිණුම් කටයුතු පැදීමේ පදනම**

ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රමාණය අදාල ගිණුම් ප්‍රතිපත්තීන් මත පිහිටා සකස් කර ඇති අතර ගිණුම් ක්‍රරන සටහන් ඉදිරිපත් කර ඇත. (මූල්‍ය ප්‍රකාශන) 2011 දෙසැම්බර් 31 දිනට සකස් කර ඇති මෙම සියලු මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත පිළිගත් ගිණුම් සංකල්ප හා ප්‍රතිපත්තීන් මත සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් මත පිළියෙළ කර ඇත.

**2.3 දේපල, යන්ත්‍ර, සූත්‍ර උපකරණ**

සියලු දේපල යන්ත්‍ර සහ උපකරණ ඓතිහාසික පිරිවැය මත සහ ඉදිකිරීම් පිරිවැය මත ගණනය කර ඇත.

ක්ෂයවීම් පිරිවැය මත අදාල කාල පරිච්ඡේදයකට හිමිකම මත ගණනය කර ඇත. ක්ෂයවීම් ගණනය කිරීම පහත පරිදි වේ.

| **වත්කම** | **අනුපාතිකය** |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| මෝටර් රථ | 25% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |

**2.4 වගකීම් සහ වෙන්කිරීම්**

සියලු ප්‍රමාණාත්මක වගකීම් ශේෂ පත්‍ර දිනයට ගිණුම් වල ඇතුලත් කර ඇත.

**2.5 විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිලාභ**

සේවක විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත යටතේ වර්ගීකරණය කර ඇත. එම ගණනය කිරීම් ක්‍රමය නම් සේවක මාස 1/2 ක වර්තමාන වැටුප සේවකයින්ගේ සේවා කාල පරිච්ඡේදය අනුව වේ. මෙම සේවක පාරිතෝෂිත වගකීම් ප්‍රමාණය සේවා කාලය වසර 05 ක් සම්පූර්ණ කළ සේවකයින් වෙනුවෙන් වේ.

ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය

මූල්‍ය ප්‍රකාශන / ශේෂ පත්‍රය

2011 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2011 | 2010 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් / බැංකු ශේෂයන් | 3.0 | 35,177,323.28 | 29,261,664.41 |
| වෙළඳ අනෙකුත් ලැබිය යුතු මුල්‍ය | 4.0 | 24,662,899.63 | 24,363,801.66 |
| පූර්ව ගෙවීම් | 5.0 | 12,995,759.93 | 2,726,217.86 |
| තැන්පතු | 6.0 | 55,000.00 | 55,000.00 |
| රඳවා ගැනීම් බදු / වැට් බදු ලැබිය යුතු | | 450,553.57 | 450,553.57 |
| **ජංගම වත්කම් එකතුව** | | **73,341,536.41** | **56,857,237.50** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, යන්ත්‍ර සූත්‍ර උපකරණ | 2.0 | 9,905,459.96 | 9,677,459.96 |
| අඩුකළා / ක්ෂයවීම් වෙන්කිරීම් | | 7,101,779.11 | 5,660,258.13 |
| **ලියා හැරිය වටිනාකම** | | **2,803,680.85** | **4,017,201.83** |
| එකතුකළා / නොනිමි වැඩ | 0 | | - |
| දිගුකාලීන වගකීම් | 0 | - | 3,500,000.00 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 2,803,680.85 | 7,517,201.83 |
| **මුළු වත්කම්** | | **76,145,217.26** | **64,374,439.33** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියන් | 7.0 | 4,323,187.94 | 1,067,751.90 |
| අනෙකුත් ගෙවිය යුතු ගෙවීම් | | - | - |
| උපචිත වියදම් | 8.0 | 638,275.94 | 265,377.85 |
| පාර්තෝෂිත වෙන්කිරීම් | 9.0 | 804,425.00 | 678,262.50 |
| **මුළු ජංගම වගකීම්** | | 5,765,888.88 | 2,011,392.25 |
| **ශුද්ධ වත්කම්** | | **70,379,328.38** | **62,363,047.08** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| මූලික ශේෂය ස්කන්ධය | | 6,433,492.69 | 6,433,492.69 |
| රඳවා ගැනීම් / ඉපැයීම් | 10 | 55,896,331.02 | 22,215,302.25 |
| වාර්ෂික ලාභය | | 8,049,504.67 | 33,714,252.14 |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **70,379,328.38** | **62,363,047.08** |

පිටු අංක 01 න් ඉදිරිපත් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති හා ගිණුම්මය සටහන් පිටු අංක 03 - 08 දක්වා ඉදිරිපත් කර ඇති දේ මෙම මුල්‍ය ප්‍රකාශ වලට ඒකාබද්ධ වේ. අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව වගකීමට යටත් වේ. මෙම ගිණුම් ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කර ඇත.

| | |
|---|---|
| අත්සන් කළේ | අත්සන් කළේ |
| විපුල වනිගසේකර | ආචාර්ය නාලක ගොඩහේවා |
| **සාමාන්‍යාධිකාරී** | **සභාපති** |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
# මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
# 2011 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අපගමන බදු | | 41,667,139.27 | 45,500,675.03 |
| සංචාරක සංවර්ධන බදු | | 25,990,827.91 | 24,303,153.50 |
| වෙනත් ආදායම | 10 | 2,814,863.37 | 3,008,945.68 |
| **මුළු ආදායම** | | 70,472,830.55 | 72,812,774.21 |
| **වියදම්** | | | |
| වැටුප් වේතන සේවක ප්‍රතිලාභ | 11 | 7,070,559.53 | 5,907,765.78 |
| සැපයුම් සහ පාරිභෝගික නිකුත් කිරීම් | 12 | 3,903,434.99 | 4,406,552.48 |
| අලෙවිකරණ සම්බන්ධිත වියදම් | 13 | 47,898,312.49 | 25,302,644.67 |
| පරියේෂණ හා සංවර්ධන | 14 | 1,813,162.68 | 2,277,456.79 |
| ක්ෂයවීම් හා පරිපාලන වියදම් | | 1,441,520.98 | 843,302.24 |
| වෙනත් වියදම් | 15 | 261,600.00 | 304,817.64 |
| මූල්‍ය පිරිවැය | 16 | 34,735.21 | 55,982.47 |
| **මුළු වියදම** | | 62,423,325.88 | 39,098,522.07 |
| **කාලපරිච්ඡේදයේ අතිරික්තය / (ඌනතාවය)** | | 8,049,504.67 | 33,714,252.14 |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

| | | |
|---|---|---|
| **මුදල් ප්‍රවාහය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින්** | | |
| ශුද්ධ අතිරික්තය (ඌනතාවය) බදු පෙර ලාභාංශ හා අතිවිශේෂ අයිතම් | | **8,049,504.67** |
| **ගැලපීම්** | | |
| ක්ෂය වීම් | 1,441,520.98 | |
| වැඩිවීම / (අඩුවීම්) අඩමාන ණය සඳහා වෙන් කිරීම | | |
| පූර්ව වර්ෂයට ගැලපුම් | (33,223.37) | |
| කාර්යය මණ්ඩල ණය / තැන්පතු පොලී | (26,188.63) | |
| බැංකු පොලී ලැබීම් | (108,674.74) | |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 126,162.50 | 1,399,596.74 |
| **මෙහෙයුම් බදු අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර** | | **9,510,861.41** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් ගලා ඒම් / (ගලා යාම්)** | | |
| (වැඩි විම) / අඩු වීම වෙළඳ ණයගැති ලැබිම් | (265,873.80) | |
| (වැඩිවීම) / අඩුවිම පූර්ව ගෙවීම් | (10,269,542.07) | |
| (වැඩි විම) / අඩු වීම වෙළඳ ණයහිමි ලැබිම් | 3,255,436.04 | |
| වැඩිවීම / (අඩු වීම) උපචිත වියදම් | 372,898.09 | (6,907,081.74) |
| **ශුද්ධ මුදල් ප්‍රමාණය මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින්** | | **2,542,019.67** |
| **මුදල් ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම් තුළින්** | | |
| කාර්යය මණ්ඩල ණය සහ තැන්පතු පොලී | 26,188.63 | |
| යන්ත්‍ර සූත්‍ර උපකරණ මිලට ගැනුම් | (228,000.00) | |
| බැංකු පොලී ලැබීම් | 108,674.74 | |
| **ශුද්ධ මුදල් ආයෝජන ක්‍රියාකාරකම් වලට යෙදවිම** | | **(93,136.63)** |
| **මුදල් ප්‍රමාණය මූල්‍ය ක්‍රියාකාරකම් තුළින්** | | |
| ප්‍රාග්ධන සංචිතය වැඩි විම | | |
| අඩු වීම දිගුකාලීන ආයෝජන | 3,500,000.00 | |
| **ශුද්ධ මුදල් මූල්‍ය ක්‍රියාකාරකම් වෙත යෙදවිම්** | | **3,500,000.00** |
| **ශුද්ධ අඩු වීම මුදල් සහ මුදල් සමාන දේ** | | 5,915,658.87 |
| **මුදල් සහ මුදල් සමාන දේ වර්ෂය මුල කාල පරිච්ඡේදය (සටහන් 02)** | | 29,261,664.41 |
| **මුදල් සහ මුදල් සමාන දේ වර්ෂය අග කාල පරිච්ඡේදය (සටහන් 01)** | | 35,177,323.28 |

**සටහන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**සටහන් 01**

| | |
|---|---|
| **මුදල් සහ මුදල් සමානදේහි සංයුතිය** | |
| අතැති මුදල සහ බැංකු (ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය) | 35,177,323.28 |
| | 35,177,323.28 |

**සටහන් 02**

| | |
|---|---|
| මුදල් ශේෂය ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 2011.01.01 | 29,261,664.41 |
| **මුදල් ශේෂය 2011.01.01** | 29,261,664.41 |

**දේපල, යන්ත්‍රසූත්‍ර උපකරණ**

**සටහන් අංක 217**

| සටහන | සංකේත අංකය | ක්ෂයවීම් | 2011.01.01 දිනට ශේෂය | එකතුකිරීම් 2011 | මාරු කිරීම් 2011 | 2011.12.31 දිනට ශේෂය | 2011.01.01 දිනට සමුච්ත ක්ෂයවීම් | 2011.12.31 දිනට ක්ෂයවීම් | 2011.12.31 දිනට සමුච්ත ක්ෂයවීම් | ශුද්ධ පොත් අගය 2011.12.31 දිනට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2.1 | 101 | කාර්යාල උපකරණ | 5,069,992.69 | 228,000.00 | | 5,297,992.69 | 4,388,346.48 | 506,999.26 | 4,895,345.74 | 402,646.95 |
| 2.7 | 103 | ලී බඩු සහ සවිකිරීම් | 728,967.27 | | | 728,967.27 | 642,505.40 | 72,896.72 | 715,402.12 | 13,565.15 |
| 2.11 | 110 | රථ වාහන | 3,158,500.00 | | | 3,158,500.00 | 197,406.25 | 789,625.00 | 987,031.25 | 2,171,468.75 |
| 2.12 | 111 | පරිගණක සහ මෘදුකාංග | 720,000.00 | | | 720,000.00 | 432,000.00 | 72,000.00 | 504,000.00 | 216,000.00 |
| | | උප එකතුව | **9,677,459.96** | 228,000.00 | | **9,905,459.96** | 5,228,258.13 | 1,441,520.98 | **7,101,779.11** | **2,803,680.85** |

## ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

| | රඳවා ගැනීමේ ඉපැයීම් | ප්‍රාග්ධන සංචිත | එකතුව |
|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය | 55,929,554.39 | 6,433,492.69 | 62,396,270.45 |
| වර්ෂයේ ලාභය | 8,049,504.67 | - | 8,049,504.67 |
| | - | - | - |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 63,979,059.06 | 6,433,492.69 | 70,379,328.38 |

පූර්ව වර්ෂයේ ගැලපීම් වූ රු. 33,223.37 ක් ගිණුම්මය වෙනස රඳවා ගැනීම් / ඉපැයීම් හි මූලික ශේෂයට ගණනය කර දක්වා ඇත.

# ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය
## මුල්‍ය ප්‍රකාශවලට අදාල ගිණුම්මය සටහන්
## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

3.0 මුදල් සහ අතැති මුදල් සහ බැංකු ශේෂ

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| මුදල් බැංකු ශේෂය - ලංකා බැංකුව | 31,388,275.28 | 28,390,016.41 |
| මුදල් බැංකු ශේෂය - මහජන බැංකුව | 3,789,048.00 | 871,648.00 |
| **මුළු මුල් සහ බැංකු ශේෂය** | 35,177,323.28 | 29,261,664.41 |

4.0 වෙළඳ / අනෙකුත් ලැබිය යුතු මුදල්

| අයිතමය | 2011 ( රු.) | 2010 (රු. ) |
|---|---|---|
| කාර්යය මණ්ඩල ණය | 861,977.79 | 458,817.75 |
| උත්සව අත්තිකාරම් | 2,000.00 | 1,000.00 |
| ලංකා ප්‍රදර්ශන සහ සමුළු සේවාව | 39,200.00 | 33,224.17 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 23,730,111.84 | 23,779,839.74 |
| චාරිකා සහ සංචරණ කළමනාකරණ ආයතනය | 450.00 | |
| සංචාරක අමාත්‍යංශය | 29,120.00 | 29,120.00 |
| සන්වේ හොලිඩේස් | 1,800.00 | 1,800.00 |
| ටැන්ජරින් ටුවර්ස් | (1,760.00) | (1,760.00) |
| ලෝක බැංකු ව්‍යාපෘතිය | - | 61,760.00 |
| **එකතුව** | 24,662,899.63 | 24,363,801.66 |

5.0 පූර්ව ගෙවීම් 24,363,801.66

| අයිතමය | 2011 ( රු.) | 2010 (රු. ) |
|---|---|---|
| ප්‍රවර්ධනයන් සඳහා ගෙවීම් | 9,843,914.21 | 2,510,848.21 |
| රක්ෂණය | 98,843.06 | 86,300.97 |
| කාර්යාල උපකරණ නඩත්තු | 357,978.56 | 129,068.68 |
| GIBTM ඉඩ වෙන් කිරීමේ පිරිවැය | 2,695,024.10 | - |
| **එකතුව** | 12,995,759.93 | 2,726,217.86 |

6.0 තැන්පතු

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| තැන්පතු - ඉන්ධන සහ දුරකථන | 55,000.00 | 55,000.00 |
| | | |
| **එකතුව** | 55,000.00 | 55,000.00 |

7.0 ණයහිමියන්

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| C.F ද මෙල් සහ පුත්‍රයෝ | 17,598.75 | 9,020.00 |
| ඇමරිකන් ප්‍රිමියම් ජල කන්ටේනර් | 1,461.39 | 1,446.09 |
| රිවේගා නර්තන ජායාරූප ශාලාව | | 50,000.00 |
| සැලසිනේ | 285,742.80 | 76,859.25 |
| යමුනා ටුවර්ස් | | 31,080.00 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 3,834,487.89 | 735,928.70 |
| මොබිටෙල් පුද්ගලික සමාගම | 12,740.10 | 31,737.21 |
| ඔවෙස්ට් ටුවර්ස් ට්‍රැවල්ස් | | 94,534.00 |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 98,469.12 | |
| ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථාව | | 19,027.10 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 21,097.02 | 13,183.04 |
| සන්ටෙල් | 3,790.87 | 4,936.51 |
| ජෙට්වින්ග් ට්‍රැවල් | 39,200.00 | |
| ටෙක්නෝ හෝම්ස් | 8,600.00 | |
| **එකතුව** | **4,323,187.94** | **1,067,751.90** |

8.0 උපචිත වියදම්

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| කාර්යය මණ්ඩලයට ගෙවිය යුතු | 241,045.00 | - |
| සභාපති දීමනා ගෙවිය යුතු | | 121,875.00 |
| වයඹ සංවර්ධන බැංකුව | | 3,750.00 |
| රඳවා ගැනීම් ගෙවිය යුතු | 16,975.00 | 18,029.45 |
| වැට් ගෙවියයුතු | 70,510.00 | |
| සේවක අර්ථසාධක ගෙවිය යුතු | 57,770.01 | 83,060.41 |
| සේවක භාරකාර අරමුදල ගෙවිය යුතු | - | 9,967.26 |
| උපයන විට බදු ගෙවිය යුතු | (138.00) | 161.00 |
| ෆින්ක්ස් ඔගිල්වි | 1,785.93 | 26,106.73 |
| ශ්‍රී ලංකා සංචරණ සුහ සාධක සංගමය | | 2,100.00 |
| එස්. ආර්. එල්. ගෙවිය යුතු | 328.00 | 328.00 |
| ව්‍යවහාරික සංඛ්‍යාන ආයතනය | 250,000.00 | |
| **එකතුව** | **638,275.94** | **265,377.85** |

9.0 සේවක පාර්තෝෂිත වෙන් කිරීම

| අයිතමය | 2011 (රු.) | 2010 (රු.) |
|---|---|---|
| පාර්තෝෂිත ඉදිරියට ගෙන ආ ශේෂය | 678,262.50 | 587,150.00 |
| එකතු කළා : වර්ෂය සඳහා ඌන වෙන් කිරීම | - | - |
| අඩු කළා : 2011 වර්ෂයේ පාර්තෝෂිත ගෙවීම | - | 91,112.50 |
| **උප එකතුව** | **678,262.50** | **496,037.50** |
| එකතු කළා : පාර්තෝෂිත වෙන් කිරීම 2011 | 126,162.50 | 182,225.00 |
| **මුළු පාර්තෝෂිත ගෙවිය යුතු** | **804,425.00** | **678,262.50** |

පාර්තෝෂිත ගිණුම් වල පෙන්නුම් කිරීම වසර 01 ක් සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින්ටත් කර ඇත. එනමුත් පාර්තෝෂිත ගෙවීමට අවම සේවා කාලය වසර 05 ක් විය යුතුය.

10 වෙනත් ආදායම්

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| පොලී ආදායම - සේවක ණය | 26,188.63 | 17,840.50 |
| බැංකු පොලී | 108,674.74 | 47,605.18 |
| ආදායම් | - | 1,906,000.00 |
| වෙනත් ආදායම් - සහභාගිවීමේ ගාස්තු | 2,680,000.00 | 1,037,500.00 |
| **එකතුව** | **2,814,863.37** | **3,008,945.68** |

11 වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| වැටුප් හා වේතන | 4,269,576.55 | 4,290,602.15 |
| නිවාඩු සහ අනෙකුත් දීමනා | 444,509.35 | 37,500.00 |
| සභාපති දීමනා | 195,000.00 | 211,875.00 |
| අතිකාල | 158,657.50 | 36,181.00 |
| මණ්ඩලීය සහභාගය - සේවක අර්ථසාධක | 504,813.25 | 499,767.40 |
| මණ්ඩලීය සහභාගය - සේවක භාරකාර අරමුදල | 107,564.59 | 100,305.73 |
| සේවක සුභසාධනය | 396,358.79 | 203,392.00 |
| සේවක නිල ඇඳුම් | 11,515.00 | 79,646.00 |
| ගමන් වියදම් - දේශීය | 561,949.00 | 156,399.00 |
| පාරිතෝෂිත | 126,162.50 | 91,112.50 |
| පැමිණීමේ දීමනා | 294,453.00 | 200,985.00 |
| **එකතුව** | **7,070,559.53** | **5,907,765.78** |

12 සැපයුම් පාරිභෝගික අයිතම්

| එකතුව | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| මුද්‍රණ සහ ප්‍රකාශන | 269,083.58 | 496,685.22 |
| දුරකථන | 662,285.30 | 560,686.20 |
| තැපැල් / භුවමාරු ගාස්තු | 49,183.59 | 34,928.94 |
| කාර්යාලීය අවශ්‍යතා | 112,914.95 | 180,651.75 |
| රක්ෂණය | 220,918.58 | 207,532.31 |
| නඩත්තු - කාර්යාලීය | 133,328.54 | 264,845.39 |
| වාහන් ඉන්ධන | 550,136.40 | 628,938.50 |
| කුලී වාහන | 934,216.70 | 1,118,198.07 |
| වාහන නඩත්තු / අළුත්වැඩියා ගාස්තු | 58,779.00 | 235,501.00 |
| විවිධ | 5,173.00 | 13,869.13 |
| වැට් ගාස්තු | 907,415.35 | 664,715.97 |
| **එකතුව** | **3,903,434.99** | **4,406,552.48** |

13 **අලෙවිකරණ සම්බන්ධිත වියදම**

| අයිතමය | 2011 ( රු.) | 2010 (රු. ) |
|---|---|---|
| විදේශ ප්‍රවර්ධන / සල්පිල් | 6,352,915.09 | 9,106,904.68 |
| මුද්‍රණ / නිෂ්පාදිත | 2,084,560.06 | 1,190,375.55 |
| ප්‍රචාරණය | 250,805.00 | 349,560.00 |
| රාමායන ව්‍යාපෘතිය | 637,299.20 | 830,274.01 |
| විශේෂ ව්‍යාපෘතිය - වෙනත් | 1,890,419.33 | 675,926.62 |
| ක්‍රියාකාරකම් / සත්කාරක | 34,479,152.60 | 10,743,310.72 |
| පිල් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය | 2,089,661.53 | 1,671,285.64 |
| සමමුතින් ඉදිරිපත් කිරීම - දේශිය | 113,499.68 | 735,007.45 |
| **එකතුව** | **47,898,312.49** | **25,302,644.67** |

14 **පර්යේෂණ හා සංවර්ධන**

| අයිතමය | 2011 ( රු.) | 2010 (රු. ) |
|---|---|---|
| ICCA සාමාජික ගාස්තු | 421,040.85 | 431,713.50 |
| දත්ත සැකසුම නඩත්තු | 15,000.00 | 155,256.78 |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යංශ පුහුණු වැඩ සටහන | 1,008,809.83 | 1,546,486.51 |
| සම්මුතින් මිල විමසුම් උපකාරක සේවා | 368,312.00 | 144,000.00 |
| **එකතුව** | **1,813,162.68** | **2,277,456.79** |

15 **වෙනත් වියදම්**

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 195,000.00 | 72,000.00 |
| පාඩු / ලියා හැරීම් | - | - |
| වෘත්තිමය ගාස්තු | - | 232,817.64 |
| පරිත්‍යාග | 66,600.00 | |
| **එකතුව** | **261,600.00** | **304,817.64** |

16 **මූල්‍ය පිරිවැය**

| අයිතමය | 2011 ( රු.) | 2010 ( රු. ) |
|---|---|---|
| හර බදු | 17,321.21 | 41,982.47 |
| බැංකු ගාස්තු | 17,414.00 | 14,000.00 |
| **එකතුව** | **34,735.21** | **55,982.47** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ටීඑම්/එච්/එස්එල්සීබී/එෆ්ඒ/11

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2012 අගෝස්තු 13 දින.

සභාපති,
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය.

**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) ( ඒ ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2012 මැයි 28 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 **විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පර්පාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පර්පාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2009 සහ 2010 වර්ෂවලදී කාර්යාංශය විසින් දරන ලද පිළිවෙලින් රු. 170,960 ක මුදලක් සහ රු. 921,602 ක මුදලක් ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කාර්යාංශයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2010 වර්ෂයේ සංචාරක සම්මාන ප්‍රදාන වැඩ සටහන වෙනුවෙන් කාර්යාංශය විසින් රු. 7,150,286 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී වැය කර තිබුණි. මෙම වැඩ සටහන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාර්ය (ශ්‍රී.ලං.සං.සං.අ) විසින් ඔවුන්ගේ ක්‍රියාකාර සැලැස්මට අනුව ජාතික වැඩ සටහනක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවත් මෙම මුදල ශ්‍රී.ලං.සං.සං. අධිකාර්යෙන් අයකර ගැනීමට පියවර නොගෙන කාර්යාංශයේ අලෙවිකරණ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.2 ගිණුම් වාර්තා පවත්වාගෙන යාම

---

සමාලෝචිත වර්ෂයේ ජර්නල් සටහන් 354 ක් මගින් එකතුව රු. 22,014,021 ක් විවිධ ගිණුම්වලට මාරුකර තිබුණි. එසේ වුවත් ජර්නල් ලෙජරයක් කාර්යාංශය විසින් පවත්වා නොතිබුණු අතර බොහොමයක් ජර්නල් සටහන් අසම්පූර්ණ විය. පිළියෙල කල සහ සහතික කළ නිලධාරින්ගේ කෙටි අත්සන් සහ සංලක්ෂය යනාදි මූලික තොරතුරු පවා ජර්නල් වවුචර් වල මුහුණතෙහි දක්වා නොතිබුණි. එසේම උපයෝගි ලියවිලි ජර්නල් වවුචර් වලට අමුණා නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජර්නල් සටහන් වල නිවැරදිභාවය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

ගිණුම්වල එකතුව රු. 15,996,195 ක් වූ විෂයයන් තුනකට අදාල උපයෝගි ලියවිලි, ගෙවීම් වලට අදාල විස්තර, වත්කම් සමීක්ෂණ වාර්තා යනාදි සාක්ෂි නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2011 ජනවාරි 11 දිනැති අංක පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, ඉදිරි මාස 6 ක කාලපරිච්ඡේදයක් සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගත් පසුව 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතනයක ඇති අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකල යුතුය. එසේ වුවත් කාර්යාංශයේ අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. විගණනය විසින් කරන ලද ගණනය කිරීම් වලට අනුව සමාලෝචිත වර්ෂයේ අතිරේක මුදල් ප්‍රමාණය රු. මිලියන 30 ක් පමණ විය.

(ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාංශය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය ප්‍රකාරව ව්‍යාපාරයක් විසින් අනුගමනය කරන ඕනෑම සුභසාධන යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත් කාර්යාංශයේ සේවකයන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එම අනුමැතිය ලබාගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඈ) 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 4.2.1 සහ 8.12 වගන්ති ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලැස්මක් සමඟ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, දක්වා ඇති පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

3.1 මූල්‍ය සමාලෝචනය

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,049,504 ක අතිරික්තය ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. 33,714,253 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,664,749 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. අලෙවිකරණ හා ප්‍රවර්ධන වියදම් සහ වැටුප් හා වේතන රු. මිලියන 29 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට ප්‍රධාන හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 අත්තිකාරම් ගෙවීම්

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම් පිළිබඳව ක්‍රියා පිළිවෙතක් සකස් කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 371 හි නියම කර ඇති සීමාවන් සැලකිල්ලට නොගෙන අත්තිකාරම් ගෙවා තිබුණි. ඇතැම් අවස්ථා වලදී ඇස්තමේන්තුවක් පවා නොමැතිව රු. 100,000 ඉක්මවා නිලධාරීන්ට අත්තිකාරම් ගෙවා තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි අංක 384(2) සහ 386 හි සඳහන් නියමයන් සහ ගෙවීම් පිළිබඳ පිළිගත් අභ්‍යන්තර පාලන පරිපාටීන් පිළිබඳ නොසලකා බැංකුවෙන් සෘජුවම මුදල් මාරුකර ගත හැකි වන පරිදි මුදල් චෙක්පත් නිලධාරීන්ට නිකුත් කර තිබුණි.

(ඇ) පිළිගත හැකි ආකාරයට අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

4.2 කාර්යසාධනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 හා 2011 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 25.3 ක් සහ රු. මිලියන 47.9 ක් කාර්යාංශයෙන් අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු සඳහා කාර්යාංශය විසින් වැය කර තිබුණි. කාර්යාංශයේ අරමුණු වලට අනුව, ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන සඳහා වන ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ආකර්ශණය කිරීම වෙනුවෙන් මෙම වියදම් දරා තිබුණි. එසේ වුවත්, ප්‍රවර්ධන කටයුතු වල ප්‍රතිඵල ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ සංස්කෘතිකාංග පිළිබඳ විදේශීය සංචාරකයන් වෙත ප්‍රසිද්ධියක් ලබාදීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක කළ "ෆීල් ශ්‍රී ලංකා" නැමැති ප්‍රවර්ධන වැඩ සටහනක් සඳහා රු. මිලියන 1.6 ක් සහ රු. මිලියන 2.08 ක් වැය කර තිබුණ. එසේ වුවත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මෙම වැඩ සටහන ක්‍රියාත්මක කර තිබුණි.

4.3 මානව සම්පත් කළමනාකරණය

---

කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 12 ක් විය. ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ සිටි තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 07 ක් හා 10 ක් විය. ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී කාර්යාංශයේ මානව සම්පත සඳහා වූ මුළු පිරිවැය පිළිවෙලින් රු. 5,374,835 ක් සහ රු. 6,174,899 ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එක් සේවකයෙකු සඳහා වූ පිරිවැය පිළිවෙලින් රු. 767,813 ක් සහ රු. 617,489 ක් විය.

4.4 වාහන උපයෝජනය

---------------------

පාලක මණ්ඩලයේ, මහා භාණ්ඩාගාරයේ සහ අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, වාහන කුලී සහ ඉන්ධන දීමනා වෙනුවෙන් පිළිවෙලින් රු. 360,000 ක් සහ රු. 194,800 ක් නිලධාරියෙකුට ගෙවා තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

-------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

-------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලට අනුව කාර්යාංශය මගින් සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. මේ අනුව, කාර්යාංශයේ කටයුතු සුදුසු මගපෙන්වීමක් සහ ඉහත සැලසුම් ප්‍රකාරව ලඟාකරගත හැකි උපාය මාර්ගික ඉලක්කයන් නොමැතිව ක්‍රියාත්මක කර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

5.2 අභ්‍යන්තර විගණනය

---------------------

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ආවරණය කරනු ලැබේ. එසේ වුවත් අංක 133 දරන මුදල් රෙගුලාසිය ප්‍රකාරව කාර්යාංශයේ මෙහෙයුම් වලට අදාලව මෙකී අභ්‍යන්තර විගණන අංශය විසින් කිසිදු විගණන කාර්යක් සිදුකර නොතිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

----------------------------

ඇස්තමේන්තුගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කල මාගේ විස්තරාත්මක වාර්තාව මගින් කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණය සහ අත්තිකාරම්
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) මුදල් කළමනාකරණය
(ඉ) අයවැය

එච්.ඒ.එස්. සමරවීර

විගණකාධිපති